PGIE
POST GRADUATE
INSTITUTE OF
ENGLISH

# පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

# වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්

## 2013

# පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

## වාර්ෂික වාර්තාව සහ ගිණුම්

## 2013

## අන්තර්ගතය


1. **දැක්ම**

2. **මෙහෙවර**

3. **අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය පිළිබඳ කෙටි විග්‍රහයක්**

   **(අ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සාමාජිකයෝ**

   (i) කළමනාකරණ මණ්ඩලය

   (ii) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

   (iii) ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

4. **අධ්‍යක්ෂ සමාලෝචනය**

   (අ) කෙටි හැඳින්වීම

   (ආ) ජයග්‍රහණයන්

   (ඇ) අපොහොසත්වීම් සහ සාධාරණීකරණය

   (ඈ) අනාගත සැලසුම්

5. **අධ්‍යක්ෂ වාර්තාව**

6. **සංශෝධිත මූල්‍ය ප්‍රකාශනය** (නව ආකෘතියට අනුව)

7. **විගණන කමිටු වාර්තාව**

8. **විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනය**

9. **විගණකාධිපතිවරයාගේ වාර්තාව**

10. **විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු**


## 1. දැක්ම

පශ්චාද් උපාධි අධ්‍යාපනයේ නායකයෙකු වීම සහ දේශීය හා ගෝලීය අවශ්‍යතාවන්ට සහ ප්‍රවණතාවන්ට සරිලන පරිදි නිර්මාණශීලී සහ සන්දර්භීය මූලාරම්භයන් සඳහා මං විවර කරන්නා වූ ශ්‍රී ලාංකේය ඉංග්‍රීසි අධ්‍යයනයේ සහ අධ්‍යාපනයේ ප්‍රමුඛයෙකු වීම.

## 2. මෙහෙවර

පර්යේෂණ, ගුරු අධ්‍යාපන, නව සොයා ගැනීම් සහ ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය සම්බන්ධ විශේෂ ශිෂ්‍යත්ව, ස්වයං මූලික හා ස්වයං සාමර්ථ්‍ය අධ්‍යයනය තුළින් පශ්චාද් උපාධි මට්ටමේ අධ්‍යයන සඳහා අවස්ථා උදාකර දීම සහ ජාතික මට්ටමේ ඉංග්‍රීසි අධ්‍යයන සඳහා උපදේශකත්වය සැපයීම හා මෙහෙයවීම.

## 3. අධ්‍යක්ෂ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණය පිළිබඳ සංක්ෂිප්ත විස්තරය



## (අ) (i) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෝ

| | නම | තනතුර |
|---|---|---|
| 1 | මහාචාර්ය එම්. චන්ද්‍රසේකර මිය | සභාපති - ඉංග්‍රීසි පිළිබඳ ස්ථාවර කමිටුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (2011.06.14 සිට) |
| 2 | ආචාර්ය එච්. වී. එම්. රත්වත්ත මිය | අධ්‍යක්ෂ<br>පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (2012.03.01 දින සිට) |
| 3 | ආචාර්ය ජේ. මනතුංග මයා | අංශ ප්‍රධාන,<br>ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අංශය,<br>මොරටුව විශ්වවිද්‍යාලය<br>(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පත් කරන ලද) |
| 4 | මහාචාර්ය ජී. ඩී. ලේකම්ගේ මිය | මහාචාර්ය, ද්විතීයික හා තෘතීය අධ්‍යාපන අධ්‍යයනාංශය, අධ්‍යාපන පීඨය<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>(ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සනාතන සභාවෙන් පත් කරන ලද) |
| 5 | මහාචාර්ය එස්. වෝල්ටර් පෙරේරා මයා | මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය<br>(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පත් කරන ලද) |
| 6 | මහාචාර්ය නෙලුකා සිල්වා මිය | මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය,<br>කොළඹ විශ්වවිද්‍යාලය<br>(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පත් කරන ලද) |
| 7 | එච්. එම්. එන්. එස්. ගුණවර්ධන මිය | අධ්‍යක්ෂ ජනරාල්,<br>නීති කටයුතු දෙපාර්තමේන්තුව,<br>මහා භාණ්ඩාගාරය<br>(මහා භාණ්ඩාගාරයේ නියෝජිත) |
| 8 | ආචාර්ය ඩී. දේවේන්ද්‍ර මිය<br><br>ආචාර්ය වි.වැ. මැදවත්තෙගෙදර මිය | අධ්‍යයනාංශ ප්‍රධාන,<br>භාෂා අධ්‍යයනාංශය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>(2013.10.09 දක්වා)<br><br>අධ්‍යයනාංශ ප්‍රධාන,<br>භාෂා අධ්‍යයනාංශය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>(2013.10.10 දින සිට) |

| | නම | තනතුර |
|---|---|---|
| 9 | ආචාර්ය එස්. ජේ. නවරත්න මයා<br><br>එස්. පී. එම්. කේ. සිරිවර්ධන මිය | ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>ප්‍රධාන ගණකාධිකාරී, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,<br>(උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය) |
| 10 | මහාචාර්ය එන්. ආර්. අර්ථනායක මයා | සේවාර්පිත මහාචාර්ය,<br>(ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාවෙන් පත් කරන ලද) |
| 11 | ආචාර්ය ජී. කොඩිතුවක්කු මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, පර්යේෂණ හා සැලසුම් අංශය, ජාතික අධ්‍යාපන ආයතනය<br>(ජාතික අධ්‍යාපන ආයතනයෙන් නම් කරන ලද) |
| 12 | මහාචාර්ය ඩබ්. අයි. සිරිවීර මයා | සේවාර්පිත මහාචාර්ය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය<br>(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පත් කරන ලද) |
| 13 | ආචාර්ය උපාලි එම්. සේදර මයා | මණ්ඩපාධිපති, ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යාපන මණ්ඩපය,<br>(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පත් කරන ලද) |
| 14 | මහාචාර්ය නෙලුෆර් ද මෙල් මිය | මහාචාර්ය,<br>ඉංග්‍රීසි අධ්‍යයනාංශය,<br>කොළඹ විශ්වවිද්‍යාලය,<br>(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පත් කරන ලද) |
| 15 | ආචාර්ය කේ.ආර්.එම්.ද. සිල්වා මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>භාෂා අධ්‍යයනාංශය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩල නියෝජනය |

## (ii) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයෝ

| | නම | තනතුර |
|---|---|---|
| 1 | ආචාර්ය එච්. වී. එම්. රත්වත්ත මිය | සභාපති, අධ්‍යක්ෂ/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය |
| 2 | මහාචාර්ය එම්. ගුණසේකර මිය | මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, පීඨාධිපති - පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය |
| 3 | ආචාර්ය කේ.ආර්.එම්.ද. සිල්වා මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 4 | ආචාර්ය වි.වැ. මැදවත්තේගෙදර මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 5 | ආචාර්ය ඩබ්. එම්. සෙනෙවිරත්න මිය | පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, (නිල බලයෙන් සාමාජික) |
| 6 | ආචාර්ය එච්.එස්. රඹුක්වැල්ල මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය |
| 7 | එල්. කේ. කුමාරණතුංග මිය | බාහිර කථිකාචාර්ය, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි අංශයේ හිටපු අධ්‍යක්ෂ |
| 8 | පී. නාගසුන්දරම් මෙණවිය | හිටපු අංශ ප්‍රධාන ඉංග්‍රීසි අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ බාහිර කථිකාචාර්ය |
| 9 | එච්. ඩී. විජේසේකර මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය |
| 10 | එම්.අයි. ජැන්ස් මිය | කථිකාචාර්ය, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය |
| 11 | ආර්.ඒ.ආර්.ඩී. රණතුංග මිය | ශිෂ්‍ය නියෝජිත (2013.02.12 දින සිට) |
| 12 | එස්. ක්‍රිෂ්ණමූර්ති මයා | ශිෂ්‍ය නියෝජිත (2011.05.26 දින සිට) |

## (iii) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයෝ

| | නම | තනතුර |
|---|---|---|
| 1 | ආචාර්ය එච්. වී. එම්. රත්වත්ත මිය | සභාපති, අධ්‍යක්ෂ/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (2012.03.01 දින සිට) |
| 2 | මහාචාර්ය නෙලුෆර් ද මෙල් මිය | මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 3 | මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ මිය | මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| 4 | ආචාර්ය ඩී. දේවේන්ද්‍ර මිය<br><br>ආචාර්ය වී.වැ. මැදවත්තේගෙදර මිය | අධ්‍යයනාංශ ප්‍රධාන, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br><br>අධ්‍යයනාංශ ප්‍රධාන, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (2013.10.10 දින සිට) |
| 5 | ආචාර්ය කේ. වර්ණපාල මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 6 | ආචාර්ය ලක්ෂ්මි ද සිල්වා මිය | හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 7 | ආචාර්ය ඩබ්. එම්. සෙනෙවිරත්න මිය | පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (නිල බලයෙන් සාමාජික) |

## 4. අධ්‍යක්ෂ සමාලෝචනය

### (අ) කෙටි හැඳින්වීම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, සහකාර මූල්‍යාධිකාරී සහ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වෙයි. මීට අමතරව පරිගණක යෙදවුම් සහකාර තනතුරු තුනකින් (03) ද පොත් තබන්නා තනතුරකින් ද කාර්යාල කම්කරු තනතුරකින් ද මෙම ආයතනය සමන්විත වෙයි.

2013 වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ පරිපාලන සහායක කාර්ය මණ්ඩලය සඳහා සාමාජිකයන් බඳවා ගන්නා ලදී. 2013 වර්ෂයේ ජූනි මස දී නව ගොඩනැගිල්ලක් සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවලිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. ඒ අනුව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් එම වර්ෂය තුළ දීම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා අනුගමනය කළ යුතු මූලික ක්‍රමවේදයන් ආරම්භ කරන ලදී.

සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවලියට සැප්තැම්බර් මස දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලැබුණු අතර පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පාඨමාලා සංවර්ධන කටයුතු ද මෙම වර්ෂය තුළ දීම ආරම්භ කරන ලදී.

අධ්‍යයන කාර්ය මණ්ඩල්‍ය සඳහා සාමාජිකයන් බඳවා ගැනීම නිසා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය නව අධ්‍යයන වැඩසටහන් සැලසුම් කිරීම, නිර්දිෂ්ඨ පොත් පත් සංශෝධනය කිරීම, නව පාඨමාලා සඳහා පොත්පත් හඳුන්වා දීම, ඇගයීම් ක්‍රමවේදයන් අනුගමනය කිරීම, මාර්ගගත ඉගෙනුම් ක්‍රමවේදය හඳුන්වා දීම, මාර්ගගත ඇගයීම් සහ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා නව විෂයන් හඳුන්වා දීම යනාදිය සිදු කිරීමේ හැකියාව ලැබුණි. එසේම ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා සංවර්ධන වැඩකටයුතු ආරම්භ කිරීමේ හැකියාව ද ලැබුණි. මෙම වර්ෂය තුළ දී ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීමේ කාර්යයෙහි නිරත වෘත්තිකයන්ගේ වෘත්තීය සංවර්ධනය ලඟාකර ගැනීමේ මූලික අරමුණ සපුරා ගැනීමේ අදහසින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් කෙටි කාලීන පාඨමාලා දෙකක් සැලසුම් කිරීමත් ආරම්භ කිරීමත් කරන ලදී. ඒ අනුව 2013 වර්ෂය සැලකිය යුතු ප්‍රමාණයක අධ්‍යයන කටයුතු සිදු කෙරුණු නව ක්‍රියාකාරකම් සහ සංශෝධනයන් සිදු කරන ලද වර්ෂයක් ලෙස සැලකිය හැකියි.

දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව මෙම වර්ෂය තුළ ඉගැන්වීම, උපදේශනය සහ ඇගැයීම යන ක්‍රියාවලීන් සිදු වෙමින් ක්‍රියාත්මක විය. එසේම පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් මෙම වර්ෂය තුළ දී ශිෂ්‍ය කේන්ද්‍රීය ඇගයුම් ක්‍රමවේදයන් වැඩි ප්‍රමාණයක් හඳුන්වා දුන් අතර e-reaesrch සම්පත් ලඟාකර ගැනීමේ හැකියාව සොයා බැලීමේ ක්‍රමවේදය පිළිබඳව ද කටයුතු කරන ලදී.

එසේම පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය ජාතික සංවර්ධන හා සංස්කෘතික කාර්යයන් සඳහා ද දායකත්වය සැපයීය.

**(ආ) ජයග්‍රහණයන්**

2013 මැයි හා ජූනි මාසයන්හි දී පිළිවෙළින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ කථිකාචාර්ය (ආධුනික) තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමත් බඳවා ගැනීමත් සිදු විය. එසේම පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පොත් තබන්නා තනතුර (දෙවන පන්තිය (ආ) ඛණ්ඩය) සහ පරිගණක යෙදවුම් සහකාර (III පන්තිය) තනතුර සඳහා බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ සිදු කිරීමත් බඳවා ගැනීමත් සිදු කළේය.

අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නව සාමාජිකයන් බඳවා ගැනීම හේතුවෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට නිර්දිෂ්ඨ ග්‍රන්ථ සංශෝධනය කිරීම, ඇගයුම් ක්‍රමවේදයන් ගොඩ නැගීම, මාර්ගගත ඉගැන්වීම් සහ ඇගයීම් හඳුන්වා දීම සහ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවට නව විෂය ඒකක හඳුන්වා දීම සිදු කිරීමේ හැකියාව ලැබුණි. පුළුල් කරන ලද පරිපාලනමය කාර්ය මණ්ඩලයේ සහයෝගය ද සමඟින් කෙටි කාලීන පාඨමාලා සැලසුම් කිරීමත් හඳුන්වා දීමත් සිදු කළ හැකි වූ අතර නව අධ්‍යයන පාඨමාලාවක් ද සැලසුම් කළ හැකි විය.

අත්දැකීම් බහුල කාර්ය මණ්ඩල සාමාජිකයන් අතුරින් එක් අයෙක් දීර්ඝ කරන ලද මාතෘත්ව නිවාඩු ලබා සිටිය දී වුව ද ශිෂ්‍යයන් සඳහා සතුටුදායක සේවයක් ලබා දීමට හැකිවිය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා සැප්තැම්බර් මස දී අනුමැතිය ලබා දෙන ලදී.

පසුගිය කිහිප අවස්ථාවක දී ම මැනවින් පෙනී ගිය දෙයක් වන්නේ (පසුගිය වාර්ෂික වාර්තා සහ අනෙකුත් සභාවන්හි දී අවධාරණය කරන ලද) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි

සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන ශිෂ්‍යයන්ගේ අධ්‍යයන භාෂා ශක්‍යතාව සහ විචාරාත්මක චින්තන හැකියාව ඉතා දුර්වල මට්ටමක පැවතීම නිසා එය ඔවුන්ගේ ඉගෙනීමට බාධකයක් ලෙස ක්‍රියාත්මක වීමයි.

2013 වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් මේ සඳහා පර්යේෂණාත්මක පදනමකින් ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවට නවාංගයක් හඳුන්වා දෙන ලදී.

මෙමගින් ශිෂ්‍යන්ගේ අධ්‍යයන භාෂා කුසලතා ඔප් නැංවීමට අදහස් කෙරිණි. එසේම කියැවීම, ලිවීම, සහ විචාරාත්මක චින්තනය ඈදියට අදාළව අධ්‍යයන සම්මුතීන් අනුගමනය කරමින් වංචනික ක්‍රියාවන් මඟහරවමින් පශ්චාද් උපාධි මට්ටමේ ඉල්ලුම සපුරාලීම සඳහා මාර්ගෝපදේශ සැපයීමත් මෙයින් අදහස් විය. මෙම පාඨමාලාව මාධ්‍යයන් දෙකක් ඔස්සේ ක්‍රියාත්මක වූ අතර (මුහුණට මුහුණලා සහ Edu 2.0 ක්‍රමවේදය මඟින් මාර්ගගතව (Online)) තනි පුද්ගල සහ කණ්ඩායම් වශයෙන් වන ශිෂ්‍ය උපදේශනය විද්‍යුත් තැපැල (e-mail) මඟින් සපයන ලදී. ශිෂ්‍යයන් බඳවා ගැනීමෙන් සතියකට පසුව මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ශිෂ්‍යයන්ට අවස්ථාව උදා විය. මෙම පාඨමාලාව හදාරන ලද සිසුන්ගේ ක්‍රියාකාරීත්වයේ ගුණාත්මකභාවය අගැයීමට අදහස් කොට ඇත.

විෂයමාලාවන් සංශෝධනය කරන ලද අතර පර්යේෂණ ක්‍රමවේදය (Research Methodology-ELP 2101) විෂයේ විෂය අන්තර්ගතය සංවර්ධනය කරන ලදී. The Psycho-Social Context of Teaching/Learning English in Sri Lanka (ELP-1301), Applied Linguistics (ELP-1201), Issues and Developments in Methodology (ELP-1202), Testing and Evaluation (ELP-1203), Teaching Grammar and the Four Skills (ELP-1101), Curriculum and Materials Design (ELP-1102), Management in ELT (ELP-1104) යන විෂයන් සඳහා නව ඉගෙනුම් ආධාරක සැකසිණි. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා Portfolio (ELP -3201) විෂය ඒකකයට අදාළ ඉගෙනුම් ආධාරක සැකසුණි. Psycho-Social Context of Teaching/Learning English in Sri Lanka (ELP-1301) විෂය සඳහා දැනුම ලබා දීමේ මාධ්‍ය (Modes of delivery) ශිෂ්‍ය ඇගයුම් ක්‍රමවේදය (Student Assesment Mechanism) සංශෝධනය කරන ලදී. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ මූලිකාංගයන් වන නිදහස් අධ්‍යයන පහසුකම් සපයන ක්‍රමවේදයන්ගෙන් සහ සාමාන්‍යයන්ගේ (Peer) ඇගැයීම්වලින් මෙම සංශෝධන සමන්විත විය.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය පර්යේෂණ මත පදනම් වූ දර්ශනපති (M.Phil) උපාධි පාඨමාලාව සහ එමඟින් දර්ශනසූරි (Ph.D) උපාධිය පිරිනැමීම සඳහා යෝජනාවලියක් සකස් කරන ලද අතර අධ්‍යයන මණ්ඩල (Board of Study) අනුමැතීන් ද ලබා ගන්නා ලදී.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අනාගත සිසුන් සඳහා මාර්ගගත (Online) ක්‍රම අධ්‍යයන පහසුකම් (e-books සහ e-journals වැනි) සැපයීම සඳහා අවශ්‍ය වන තොරතුරු තාක්ෂණ සම්පත් හඳුනා ගැනීම සඳහා කටයුතු යොදන අතර මෙම කටයුත්ත සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්ය මණ්ඩලය සහ විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාලයීය කාර්ය මණ්ඩලයෙන් සමන්විත අනු කමිටුවක් පත් කරන ලදී. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්ය මණ්ඩලය සහ පුස්තකාලයීය කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡාවක් ද මාර්ගගත සම්පත් (Online Resources) ලබා ගැනීම සම්බන්ධයෙන් (පොත් සහ සඟරා) පවත්වන ලදී.

මේ වර්ෂය තුළ ශිෂ්‍යයන් 05 දෙනෙක් ඔවුන්ගේ පර්යේෂණ උපාධි නිබන්ධය සම්පූර්ණ කොට ඇත. මේ අතරින් දෙදෙනෙක් කැනඩාවේ පදිංචිකරුවෝ වෙති. ඔවුන් විසින් තමන්ගේ පර්යේෂණ නිබන්ධය සම්පූර්ණ කරන ලද්දේ ස්කයිප් (Skype) සහ මාර්ගගත (Online) ක්‍රමවේදයන් මඟිනි. මේ සඳහා අවශ්‍ය උපදේශකත්වය සපයන ලද්දේ මාර්ගගත (Online) සහ ස්කයිප් (Skype) ක්‍රමවේදය අනුගමනය කරමිනි. මෙසේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ශිෂ්‍යයන්හට ඔවුන්ට අභිමත වේලාවක දී සුදුසු අන්දමකින් සුදුසු ස්ථානයක සිට අධ්‍යාපනය ලැබීමේ පහසුකම ශිෂ්‍යයන්හට ලබා දෙමින් දූරස්ථ අධ්‍යාපනයේ අරමුණු ලඟාකරගෙන ඇති බව කිව හැකිය.

ශිෂ්‍යයන්ගෙන් දස දෙනෙක් (10) පර්යේෂණ සැසියේ දී ඔවුන්ගේ පර්යේෂණයන් සාර්ථකව ඉදිරිපත් කළ අතර එයින් දෙදෙනෙක් විදේශ ගත වීම කණගාටුවට කරුණකි.

දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ නව විෂය ඒකක දෙකක් සඳහා විෂය මාලාව සම්පාදනය කරන ලද අතර ඉගෙනුම් ආධාරක (Course Materials) ද සැකසිණි. එම විෂය ඒකක දෙක වන්නේ, Teacher Developmet and Supervision (ELP-1105) සහ Technology in ELT (ELP-1103) යන විෂයන්ය. Technology in ELT විෂය ශිෂ්‍යයන් සඳහා සැප්තැම්බර් දෙසැම්බර් මාසවල දී මාර්ගගත පහසුකම් (Online Technologies) මඟින් ලබා දෙන ලදී.

කැනඩාවේ පදිංචි ශිෂ්‍යයන් දෙදෙනෙක් සඳහා සම්මුඛ විභාගය (Viva-voce examination) පළමු වතාවට Skype තාක්ෂණය මඟින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට සිදු කළ හැකි විය. මෙම උත්සාහය සාර්ථක විය.

2013 මැයි මස දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව අයදුම්පත් (100) ක් නිකුත් කරනු ලැබූ අතර එයින් සිසුහු පනස් දෙදෙනෙක් (52) ලියාපදිංචි සඳහා සුදුසුකම් ලැබූහ. පසුගිය වසරේ දී දක්නට ලැබුණු පරිදි බඳවා ගැනීමේ තරග විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් බහුතරයකගේ කුසලතාව අසතුටුදායක විය.

ඊට හේතු වී ඇත්තේ අධ්‍යයනමය භාෂා හැකියාව සිසුන් තුළ හීන වීමත්, දුර්වල විචාරාත්මක චින්තන හැකියාව සහ විෂයානුබද්ධ දැනුම දුර්වල වීමත්ය. සිසුහු 38 දෙනෙක් උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූහ. අප ආයතනයේ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශය මඟින් ද ඉංග්‍රීසි සහ සංස්කෘතික අධ්‍යයනය සඳහා වන ඉංග්‍රීසි ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවා තිබුණි. මේ හේතුවෙන් අපගේ පාඨමාලාව සඳහා ලියාපදිංචි වන සිසුන්ගේ ප්‍රමාණයේ අඩුවක් දක්නට ලැබුණි. එසේ වූයේ අදාළ පශ්චාද් උපාධි පාඨමාලා දෙකම එකම ක්ෂේත්‍රයක් ඉලක්ක කර ගැනීමේ හේතුවෙනි. පළමු වසර විෂය ඒකක සම්පූර්ණ කරන ලද සිසුහු 45 දෙනෙක් පර්යේෂණ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ විෂය ඒකක (Research Courses) සඳහා ලියාපදිංචිය ලැබූහ.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අනෙකුත් ජාතික ආයතන, ජාතික අධ්‍යාපන ආයතනය සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව භාෂා අධ්‍යාපන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සහ එම ක්ෂේත්‍රයේ ද්විභාෂීය අධ්‍යාපන උපාධි පාඨමාලා ඇරඹීම සහ ඒකාබද්ධ පර්යේෂණ පිළිබඳව සාකච්ඡා ඇරඹීය. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අධ්‍යයන ප්‍රජාව සඳහා සම්මන්ත්‍රණ දෙකක් සංවිධානය කරමින් පුළුල් පරාසයකට අධ්‍යාපනය සහ පර්යේෂණ එළි දැක්වීමේ ඉලක්කය සපුරා ගත්තේය. මේ සම්බන්ධයෙන් දායක කර ගන්නා ලද කථිකයන්, ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පත් ලේඛකයන්, පර්යේෂකයන් සහ අධ්‍යාපනඥයන් ය. එයින් දෙදෙනෙක් මහාචාර්ය සුරේෂ් කණගරාජා (ඇ.එ.ජනපදය) සහ ආචාර්ය ජෝර්ජ් බ්‍රෙන් ය (හොංකොං).

මහාචාර්ය සුරේෂ් කණගරාජා (The Edwin Erle Sparkes Proffesor, Director Migration Studies, Project Department of Applied Linguistics and English Pennsylvania State University/USA) මහතා විසින් "New Definitions of English

Proficiency and Changing Pedagogical Proiorities" යන මැයෙන් ප්‍රසිද්ධ දේශනයක් පැවැත්වී ය. සියලු විශ්වවිද්‍යාලයන්ගෙන් සහ අනෙකුත් අධ්‍යාපන ආයතනවලින් පැමිණි එකසිය පනහකට (150) අධික ශ්‍රාවක පිරිසක් මේ සඳහා සහභාගි වූහ.

ව්‍යවහාරික වාග්විද්‍යා සඟරාවන්හි පළ කිරීම් පිළිබඳ සම්මන්ත්‍රණයක් : සඟරා සංස්කාරකවරයෙකුගේ උපදෙස් ස්වරූපයෙන් ජාත්‍යන්තර ඉංග්‍රීසි භාෂා උපදේශකවරයෙකු සහ හොංකොංහි චීන විශ්වවිද්‍යාලයේ හිටපු වාග්විද්‍යා සහාය මහාචාර්යවරයෙකු සහ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ සඟරාවෙහි (ATEL) සංස්කාරක වූ ආචාර්ය ජෝර්ජ් බ්‍රෙන් මහතා විසින් පවත්වන ලදී. ඔහු ඇ.එ.ජනපදයේ "Non-native Speaker English Teachers-TESOL" ආයතනයේ සමාරම්භක සභාපතිවරයාද විය. ශ්‍රී ලංකාවේ විවිධ විශ්වවිද්‍යාලයන්හි ඉංග්‍රීසි විෂය උගන්වන බොහෝ විශ්වවිද්‍යාල ආචාර්යවරු මෙම සැසිය සඳහා සහභාගී වූහ.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මෙම වර්ෂය තුළ දී පොත් තබන්නෙකු (Book Keeper) සහ පරිගණක යෙදවුම් සහකාරවරයෙකු (Computer Application Assistant) බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම ද බඳවා ගැනීම ද කළේය. මෙම කාලීන බඳවා ගැනීම් හේතුවෙන් එක් පරිපාලන සහායක කාර්ය මණ්ඩල සාමාජිකාවක් දීර්ඝ කරන ලද මාතෘත්ව නිවාඩු ලබා සිටිය දී වුව ද ශිෂ්‍යයන්ට කිසිදු බාධාවකින් තොරව සේවය සැපයීමට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකියාව ලැබුණි. එසේම අප ආයතනයට මුල්වතාවට මුළු වර්ෂය සඳහාම නියමිත වැඩකටයුතු සැලසුම් කර ගැනීමට හැකියාව ලැබුණි.

එසේම පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කම්කරු (විශේෂ ශ්‍රේණිය) සේවයේ නියුතුව සිටි සේවකයා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සිදු වූ අතර මූලික විනය පරීක්ෂණයක් පැවැත්වීය. 2013 වර්ෂය ඇතුළත මේ සම්බන්ධයෙන් මූලික විනය පරීක්ෂණයකින් අනතුරුව විධිමත් විනය පරීක්ෂණයක් ද පැවැත්විණි. ඉහත සඳහන් කරන ලද කම්කරු තනතුරට අදාළ රාජකාරී ඉටු කරවා ගැනීම සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ රාජකාරී කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලය ආයතනයේ උපයන ලද ආදායම් භාවිත කරමින් දෛනික ගෙවීමේ පදනම මත සේවකයෙකු බඳවා ගැනීමට තීරණය කළේය.

**(ඇ) ශිෂ්‍ය තොරතුරු**

2012 වර්ෂය තුළ දී පර්යේෂණ මට්ටමේ සිටි සිසුන් පස්දෙනෙක් ඔවුන්ගේ පර්යේෂණ උපාධි නිබන්ධ සම්පූර්ණ කළහ. දෙදෙනෙක් විදෙස්ගත වූ අතර සෞඛ්‍ය හේතු මත දෙදෙනෙකුට සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය. එසේම තවත් දෙදෙනෙකුට පවුලේ සමීපතමයන්ගේ අසනීප තත්වය හේතුවෙන් සම්පූර්ණ කිරීමට නොහැකි විය. එසේම සිසුන් දසදෙනෙක් පර්යේෂණ සැසියේ දී ඔවුන්ගේ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කළ අතර පර්යේෂණ කටයුතු ආරම්භ කළහ.

දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා නවක සිසුන් තිස් අට දෙනෙක් (38) ලියාපදිංචි වූහ. එසේම පළමු වර්ෂයට නියමිත විෂයන් සම්පූර්ණ කරන ලද හතලිස් පස් දෙනෙක් (45) දෙවන කොටස සඳහා ලියාපදිංචිය ලැබූහ. සිසුන් හතලිස් හය දෙනෙක් (46) අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා සම්පූර්ණ කළහ. 2013 වර්ෂය ඇතුළත පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් මෙහෙයවන ලද පාඨමාලා සම්පූර්ණ කරන ලද සමස්ත ශිෂ්‍ය පිරිස පනස් එකක් (51) වූහ.

**(ඈ) අපොහොසත් වීම සහ සාධාරණීකරණය**

අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ රාජකාරී කටයුතු අවශ්‍ය ප්‍රමාණයෙන් ඉටු කිරීමට ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ක්‍රියාකාරීත්වයට බාධාවක් විය. තව ද සති අන්තවල දී පංතිකාමර ඉඩ පහසුකම් අඩු වීම නිසා එක් විෂය ඒකකයකට/පාඨමාලාවකට වඩා වැඩියෙන් දේශන පැවැත්වෙන අවස්ථාවන්හි දී ඉඩකඩ පිළිබඳ ප්‍රශ්න මතුවිය.

අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා ද ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම මහත් බාධාවක් විය. වර්තමානයෙහි අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි ආචාර්යවරු තිදෙනෙක් කුඩා කාමරයක් පරිහරණය කරති. සාකච්ඡා ආදිය සඳහා වෙනත් කිසිදු ඉඩකඩක් නොමැති වීම නිසා පර්යේෂණ මට්ටමේ ශිෂ්‍යයන් සඳහා උපදේශනය සැපයීම සහ අඛණ්ඩ අවධානය අවශ්‍ය කෙරෙන නිර්දිෂ්ඨ කෘති සම්පාදනය බඳු කාර්යයන්හි නිරතවීමට බාධකව පවතී. එසේම පරිපාලන සහායක කාර්ය මණ්ඩල සාමාජිකයන් හත් දෙනෙකු (07) විසින් පරිහරණය කරනු ලබන්නේ ඉතා කුඩා ඉඩකඩ ප්‍රමාණයක් වන අතර ඒ අතර ඉතා විශාල ප්‍රමාණයක් ලිපිගොනු ආදිය ද වේ. අලුත් ගොඩනැඟිල්ල ඉදි වූ පසු ප්‍රමාණවත් ඉඩකඩ නොමැතිවීමේ ගැටලුව විසඳෙනු ඇත.

(ඉ) අනාගත සැලසුම්

1. දර්ශනපති උපාධිය (M.Phil) මඟින් දර්ශනසූරි (Ph.D) උපාධියට සුදුසුකම් ලබන නව උපාධි පාඨමාලාව ඇරඹීම.

2. ඉංග්‍රීසි වෘත්තීය භාවිතය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (Postgraduate Diploma in Professional Practice in English) ප්‍රදානය කිරීම සඳහා යෝජනාවලිය සැකසීම.

3. දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවට අදාළ නීති රීති (Rules and Regulations) සැකසීම.

4. සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ විෂයමාලාව සැකසීම, ඉගෙනුම් ආධාරක පොත්පත් ශිෂ්‍ය උපදෙස් ආදිය සැකසීම.

5. දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ආරම්භ කිරීම.

6. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් තෝරා එවනු ලබන අධ්‍යාපන සේවයේ වෘත්තිකයන් සඳහා දෙවන භාෂා පිළිබඳ පරීක්ෂණ සහ ඇගැයීම (Testing and Evaluation) පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව පිරිනැමීම.

7. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කර ඇති ගුරුවරුන්ගේ උසස්වීම් හා බඳවා ගැනීම් සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පිළිගැනීම ඇති කිරීම.

8. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා ගුරුවරුන්ට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් රාජකාරී නිවාඩු ලබා ගැනීමට කටයුතු කිරීම.

9. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ගොඩනැගිල්ල ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය මූලික වැඩකටයුතු සම්පූර්ණ කිරීම.

10. ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා අවශ්‍යතා පදනම් කොට ගත් කෙටි කාලීන පාඨමාලා සැලසුම් කිරීම හා මෙහෙයවීම.

11. ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනයේ ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම.

12. විශ්වවිද්‍යාලයන්හි ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහායවීම.

(ඊ) සම්පත් හා ශිෂ්‍ය තොරතුරු

| ආයතනය | පාඨමාලාව | සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව | සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය | සමස්ත අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (PGIE) | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව (MA in TESL)<br>දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (PG Dip. in TESL) | 23 | 04 | 07 |
| එකතුව | 02 | 23 | 04 | 07 |

(උ) දේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | 2013 ශිෂ්‍ය කණ්ඩායම | පළමු වසර ශිෂ්‍ය කණ්ඩායම (Part I) | දෙවන වසර ශිෂ්‍ය කණ්ඩායම (Part II) | උපාධිය සමත් වූ සිසුන් |
|---|---|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | - | 07 | 13 | 03 |
| | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | ඉංග්‍රීසි | 35 | 48 | 02 | - |
| මුළු ගණන | | | 35 | 55 | 15 | 03 |

(ඌ) අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

| ආයතනය | විෂය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු | මහාචාර්යවරු | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු | කථිකාචාර්යවරු | ආධුනික කථිකාචාර්යවරු | උපදේශක |
|---|---|---|---|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය | - | ඉංග්‍රීසි | - | - | 02 | - | 01 | - |
| මුළු ගණන | - | - | - | - | 21 | - | 01 | - |

(එ) අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

| ආයතනය | ජ්‍යෙෂ්ඨතම කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවක |
|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය | - | - | 04 | 01 |
| මුළු ගණන | - | - | 04 | 01 |

(ඒ) පර්යේෂණ නව සොයාගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ තොරතුරු

| විෂය | ප්‍රකාශිත | මුද්‍රිත | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| (අ) පර්යේෂණ | 03 | - | 11 |
| (ආ) නව සොයාගැනීම් | - | - | - |
| (ඇ) සඟරා | - | - | - |
| (ඈ) පොත් | - | - | - |
| (ඉ) ශාස්ත්‍රීය ලිපි | 02 | - | - |
| (ඊ) වෙනත් | - | - | - |
| මුළු ගණන | 05 | - | 01 |

(ඓ) වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු

| විෂය | සහභාගි වූ | සම්පූර්ණ කරන ලද | මෙහෙයවන ලද |
|---|---|---|---|
| (අ) පශ්චාද් උපාධි වැඩසටහන් ගණන | - | - | 01 |
| (ආ) පශ්චාද් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් ගණන | - | - | 01 |
| (ඇ) උපාධි වැඩසටහන් ගණන | - | - | - |
| (ඈ) ඩිප්ලෝමා වැඩසටහන් ගණන | - | - | - |
| (ඉ) සහතිකපත්‍ර වැඩසටහන් ගණන | - | - | 02 |
| (ඊ) වෙනත් | - | - | 02 |
| එකතුව | - | - | 06 |

(ඔ) අලුතින් ආරම්භ කරන ලද පාඨමාලාවන් පිළිබඳ විස්තර

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | පශ්චාද් උපාධි සහතික පත්‍ර | පශ්චාද් උපාධි ඩිප්ලෝමා | ශාස්ත්‍රපති | දර්ශනපති | දර්ශනසූරි |
|---|---|---|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (PGIE) | අ.පො.ස උසස් පෙළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව (ශ්‍රී ලාංකික විෂය මාලාව) | ඉංග්‍රීසි | - | - | - | - | - |
| | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි පරීක්ෂණ හා ඇගැයීම පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව | ඉංග්‍රීසි | - | - | - | - | - |
| එකතුව | 02 | | - | - | - | - | - |

## (ඔ) මෙම වාර්තාවට අදාළ අනෙකුත් තොරතුරු/කාර්ය සාධනය

2011 සහ 2012 වර්ෂයට අදාළ ශිෂ්‍ය කාර්ය සාධනය පිළිබඳ විධිමත් අධීක්ෂණය මත පදනම්ව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීමේ විධික්‍රමය වෙනස් කරන ලදී. මෙම වෙනස ආරම්භ කරන ලද්දේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ගෝලීය ප්‍රවණතා වෙනස්වීම් මත පදනම්ව සහ ශිෂ්‍ය කාර්ය සාධනය අධීක්ෂණය කිරීම මඟිනි.

අවශ්‍ය දැනුම ලබා දෙන්නා වූ වෘත්තීය කාර්යමය අත්දැකීම්, ශක්‍යතා හා කුසලතා හඳුනා ගැනීම විධිමත් අධ්‍යාපනයට සමානව සිදු කෙරේ. මෙම ක්‍රමවේදය විශේෂයෙන්ම එංගලන්තයේ එඩින්බර්ග් විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පාසල සහ ශ්‍රී ලංකාවේ කළමනාකරණ පශ්චාද් උපාධි ආයතනය යන ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පත් ආයතනවල ක්‍රියාත්මක කෙරෙන්නකි. එම නිසා බඳවා ගැනීමේ විභාගයෙන් උසස් ලකුණු හිමිකරගන්නා සිසුන් සහ ඉංග්‍රීසි ජාතික සහතික පත්‍රය සහිතව මූලික ඉංග්‍රීසි භාෂා ගුරු පුහුණුව ලබා ගැනීමෙන් පසුව ගුරු සේවයේ වසර දහයක (10) ක සේවා කාලයක් සහිත සහ තවදුරටත් කෙටි කාලීන ඉංග්‍රීසි පාඨමාලා හදාරා ඇති සිසුන් දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවා ගන්නා ලදී. 2014 මැයි මස අවසානය වන විට සම්පූර්ණ කරන ලද විෂයන්ට අදාළව ඔවුන්ගේ කාර්ය සාධනය අනුව පෙනී යන්නේ ඔවුන්ගේ සාමානයන් (Peers) සමඟ සමාන මට්ටමෙන් අධ්‍යාපනය සිදු කරන බවයි. මෙම ශිෂ්‍යයන් ඉතා උනන්දුවෙන් සහ කැපවීමෙන් කටයුතු කරන බව පෙනේ. මෙසේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් සාම්ප්‍රදායික ක්‍රමවේදයට බාහිරව සුදුසුකම් ලත් ශිෂ්‍යයන් සඳහා ද පශ්චාද් උපාධි අධ්‍යයන පහසුකම් ලබා දෙමින් ශ්‍රී ලංකාවේ බහුතරයක් වන ශිෂ්‍යයන් සඳහා පශ්චාද් උපාධි අධ්‍යයන පහසුකම් සපයනු ලැබ ඔවුන් දිරිමත් කරමින් කටයුතු කොට ඇති බව පෙන්වා දිය හැකිය. EDU.2 ක්‍රමවේදය මගින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මාර්ගගත (online) ඉගැන්වීම ද ආරම්භ කළේය. එය වඩාත් සාම්ප්‍රදායික මාර්ගගත නිබන්ධයන් සහ මාර්ගගත පාඩම්වලට අමතරව වන ශිෂ්‍යයන්ට තම සාමානයන්ගේ කණ්ඩායම් (Peer Groups) නිර්මාණය කොට ගෙන තම හිතවතුන් සහ ආචාර්යවරුන් සමඟ සාකච්ඡා සඳහා සහභාගී විය හැකි ක්‍රමයකි. මෙය නව අධ්‍යයන සන්නිවේදන (Academic Communication) පාඨමාලාව සඳහා භාවිත කරන ලදී. ශිෂ්‍යයන් අතරින් බහුතරයක් දෙනා මෙය සිත් ඇද ගන්නා මෙන්ම ඵලදායී එකක් බව පෙන්වා දුන් නමුත් වයස්ගත ශිෂ්‍යයන් කිහිප දෙනෙක් සහ තාක්ෂණික වශයෙන් අඩු පහසුකම් ඇති ප්‍රදේශවල ජීවත්වන ශිෂ්‍යයන් දෙදෙනෙක් මේ සම්බන්ධයෙන් අපහසුතාවට පත්වූහ.

මෙම පාඨමාලාව දෙයාකාරයකින් පවත්වනු ලබන හෙයින් මේ ශිෂ්‍යයන්ගේ අවශ්‍යතාවන් සපුරාලීමට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකියාව ලැබුණි.

කෙසේ වුව ද මේ මඟින් පෙන්වා දෙන ලදදේ තාක්ෂණය සඳහා ප්‍රවේශයන් පුළුල් කෙරෙන මුළුමනින්ම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පමණක් ශ්‍රී ලංකාවේ ගුරුවරු සඳහා පාඨමාලා පැවැත්විය නොහැකි බවයි.

ජාතික සංවර්ධනය සහ සංස්කෘතිය සඳහා දායකත්වය සැපයීමේ කාර්යයට ද පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය දායක විය. එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් ග්‍රේෂන් ට්‍රස්ට් (Gration Trust) කමිටුවේ සාමාජිකයෙක් ලෙස සහ "ස්වර්ණ පුස්තක" සම්මාන තේරීම් කමිටුවේ (විනිශ්චය මණ්ඩලයේ) සාමාජිකයෙක් ලෙස ද කටයුතු කළේය. "ග්‍රේෂන් ත්‍යාගය" පිරිනමනු ලබන්නේ වාර්ෂිකව ශ්‍රී ලංකාවේ පදිංචි ඉංග්‍රීසි සාහිත්‍යමය නිර්මාණ කාර්යයෙහි නිරත වන අග්‍රගණ්‍ය සාහිත්‍යධරයා වෙනුවෙනි. මෙය ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක ලේඛන කාර්යයෙහි නිරත ඉංග්‍රීසි සාහිත්‍යධරයා සඳහා පිරිනැමේ.

## 5. අධ්‍යක්ෂ වාර්තාව

2013 වර්ෂය තුළ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය තම ආයතනය සතුව තිබූ සියලු පුරප්පාඩු පිරවීම සිදු කළේය. දෙවන කාර්තුව තුළ දී අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙක් රාජකාරී ඇරඹූහ. පොත් තබන්නා (දෙවන පන්තිය) සහ පරිගණක යෙදවුම් සහකාර (III පන්තිය) තනතුරු සඳහා ද බඳවා ගැනීම් දෙවන කාර්තුව තුළ දී සිදු විය. එසේම පහත සඳහන් ක්‍රියාවන් සම්පූර්ණ කිරීමට ද හැකියාව ලැබුණි.

**අධ්‍යයන ප්‍රගතිය**

(අ) ශ්‍රී ලාංකේය අධ්‍යයන පිළිබඳ ඇමරිකානු ආයතනයේ සහයෝගය ඇතිව මාර්ගගත සම්පත් භාවිතය පිළිබඳව පර්යේෂණ ශිෂ්‍යයන් සඳහා වැඩමුළුවක් පැවැත්විණි.

(ආ) සංහිතා වාග්විද්‍යාව (Corpus Linguistics) සිට ගුරු අධ්‍යාපනය (Teacher Education) දක්වා පරාසයක මාතෘකා සමුදායකින් සමන්විත වන පරිදි ගවේෂණාත්මකව පර්යේෂණ ශිෂ්‍යයන් සමඟ වාර්ෂික පශ්චාද් උපාධි පර්යේෂණ සැසිය මෙහෙයවීම.

(ඇ) දෙවන භාෂා පරිසරය තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (PG. Dip/MA in Teaching Literaure in a Second Language Context) සඳහා වන යෝජනාවලිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීම (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස්වීම 08.08.2013).

(ඈ) දෙවන භාෂා පරිසරය තුළ සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ විෂය මාලාව සැකසීම පිළිබඳ පාඨමාලා කණ්ඩායම් (Course Team) ස්ථාපනය කිරීම සඳහා පාඨමාලා සැකසීම පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.

(ඉ) දර්ශනපති (M.Phil) උපාධිය මඟින් දර්ශනසූරි (Ph.D) උපාධිය හැදෑරීම සඳහා වන යෝජනාවලියට අදාළ අධ්‍යයන මණ්ඩල (BOS) සහ කළමනාකරණ මණ්ඩල (BOM) අනුමැතිය ලබා ගැනීම.

(ඊ) ගුරුවරුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා කෙටි කාලීන පාඨමාලා දෙකක් සැලසුම් කිරීම සහ ගොඩනැගීම. (අ.පො.ස උසස් පෙළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශ්‍රී ලාංකේය විෂය මාලාවට අදාළව) සහ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි විෂය පිළිබඳව පරීක්ෂණ හා ඇගයීම යන විෂය දෙකට අදාළව.

(උ) EDU 02 ක්‍රමවේදය මඟින් මාර්ගගතව (online) ක්‍රියාත්මක වන විෂයක් හඳුන්වා දීම.

(ඌ) දැනට පවත්නා ඇගයීම් ක්‍රමවේදය නැවත වෙනස්කම්වලට භාජනය කිරීම සහ ශිෂ්‍ය කේන්ද්‍රීය, නිදහස් අධ්‍යයනයට උපකාරවන සහ අධ්‍යයන ප්‍රජාවක් බිහිකරවන නව ඇගයුම් ක්‍රමවේදයක් හඳුන්වා දීම. මෙම සාම්ප්‍රදායික ක්‍රමයෙන් බැහැර වූ ඇගයුම් ක්‍රමවේදය ශිෂ්‍යයන් කණ්ඩායම් ලෙස වැඩ කිරීම, වත්මන් භාවිතයන් විචාරශීලීව ඇගයීම, පර්යේෂණ කුසලතා සහ විනිවිද දක්නා ශක්‍යතාවන් ඇගයීමට හසුකර ගනියි. මෙම ඇගයීම් සාම්ප්‍රදායික ලේඛනමය ඇගයීම්වලට අමතරව ක්‍රියාත්මක විය.

(එ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාලයත් සමග සම්බන්ධවීම සහ මාර්ගගත සම්පත් සඳහා සම්බන්ධවීමට අවශ්‍ය සම්බන්ධතාව සපයන තොරතුරු සම්පත් සහ ක්‍රමවේදයන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් හඳුනා ගන්නා ලදී.

(ඒ) ජන සමාජය සඳහා පර්යේෂණ සම්මන්ත්‍රණයක් ජාත්‍යන්තරව ප්‍රසිද්ධියට පත් පර්යේෂකයෙකු සහ ලේඛකයෙකු වන මහාචාර්ය සුරේෂ් කනකරාජා මහතා විසින් පැවැත්වීමට කටයුතු යෙදීම. එඩ්වින් අර්ල් සම්මානික මහාචාර්ය සුරේෂ් කනකරාජා මහතා ඇමරිකා එක්සත් ජනපදයේ පෙන්සිල්වේනියා රාජ්‍ය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි සහ ව්‍යවහාරික වාග්විද්‍යාව පිළිබඳ අධ්‍යයනාංශයේ විදේශ අධ්‍යයන පිළිබඳ අධ්‍යක්ෂවරයාය. මෙතුමා විසින් "New definitions of English proficiency and changing pedagogical priorities"යන මාතෘකාව යටතේ දේශනය පවත්වන ලදී.

(ඓ) සියලු විශ්වවිද්‍යාලයන්හි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා පර්යේෂණ වැඩමුළුවක් ජාත්‍යන්තර කීර්තියට පත් ආචාර්ය ජෝර්ජ් බ්‍රේන් මහතා විසින් මෙහෙයවීම. ආචාර්ය ජෝර්ජ් බ්‍රේන් මහතා ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ආසියානු සඟරාවේ (Asian Journal of English Language Teaching) සංස්කාරකවරයාය. මොහු ජාත්‍යන්තරව ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ උපදේශකයෙකු මෙන්ම හොංකොංහි චීන විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික වාග්විද්‍යාව පිළිබඳ හිටපු සහාය මහාචාර්යවරයා ද වෙයි.

(ඔ) අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අතර ඒකාබද්ධ පර්යේෂණ සඳහා පහසුකම් සැපයීම සිදුවිය. මේ අනුව ජාතික අධ්‍යාපන ආයතනය සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ වී භාෂා අධ්‍යාපනයට අදාළව (ද්විභාෂා මාධ්‍ය උපදේශනය) මෙම අධ්‍යයන කටයුතු ක්‍රියාත්මක විය. පශ්චාද් උපාධි මට්ටමේ ගුරු වෘත්තීය සංවර්ධන පාඨමාලා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් සැපයීම සහ ද්විභාෂා මඟින් මෙහෙයවීම මෙන්ම අධ්‍යාපන වැඩසටහන්වලට අදාළ පර්යේෂණ පැවැත්වීම ද මීට අදාළව සිදු කෙරේ. මීට අදාළ වැඩිදුර සාකච්ඡා සැලසුම් කරන ලද අතර පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට මාධ්‍ය උපදේශනය සහ ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට දායක විය හැකි අන්දම සාකච්ඡාවට භාජනය විය.

(ඕ) ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයන්හි ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකක සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පහසුකම් සැපයීම සිදු කෙරිණි. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල කිහිපයක ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකවල සාමාජිකයන් කිහිප දෙනෙක් සමඟ මූලික සාකච්ඡා වට කිහිපයක් සිදු කෙරිණි. මෙම සාකච්ඡාවලට අනුව දැනට පවත්නා ගැටලු පිළිබඳව අවධානය ලක් කරන ලද අතර ලේඛනයක් සකස් කොට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරිණි. එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයන්ට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ද පාදක කරගන්නා ලදී.

(ඖ) විෂය ඒකක කිපයකට අදාළ ඉගෙනුම් ආධාරක සහ විෂය නිර්දේශ සංශෝධනය කරන ලදී. එසේම නව ඉගෙනුම් ආධාරක හඳුන්වා දීම ද සිදු කෙරිණි. පර්යේෂණ ක්‍රමවේදය (Research Methodology) - ELP2101, ව්‍යවහාරික වාග්විද්‍යාව (Applied LInguistics) - ELP1201, ක්‍රමවිද්‍යාවේ ගැටලු සහ සංවර්ධනයන් (Issues and Developments in Methodology) - ELP1202, පරීක්ෂණ සහ ඇගයීම (Testing and Evaluation) - ELP1203, ව්‍යාකරණ ඉගැන්වීම සහ සිව් කුසලතා (Teaching Grammar and the Four Skills) - ELP1101, ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි ඉගැන්වීම සහ ඉගෙනීම පිළිබඳ මනෝවිෂයක සහ සාමාජීය පරිසරය (The Psycho-Socail Context of Teaching Learning English in Sri Lanka) - ELP1301 විෂයමාලා සහ ඉගෙනුම් ආධාරක සැකසීම (Curriclum and Material Design) - ELP1102, ඉංග්‍රීසි ඉගැන්වීමේ කළමනාකරණය (Management in ELT) - ELP1104 යන විෂයන් මේ අනුව සංශෝධනය විය.

(ක) Development of a Reflective Portfolio විෂයට අදාළව විෂය මාලාව සහ ඉගෙනුම් ආධාරක සැකසිණි. මෙය දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවෙනි කොටසට අදාළ විෂය ඒකකයකි.

(ඛ) 2012 තෙක් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් එකම විකල්ප විෂය වූ ඉංග්‍රීසි ඉගැන්වීමේ කළමනාකරණය (Management in ELT) - ELP1104 විෂය පමණක් ලබා දෙන ලදී. කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තත්වය මත සිදු වූවකි. 2013 වර්ෂයේ දී අනෙකුත් විෂයන් දෙකකට අදාළ විෂයමාලා සැකසීමත් ඉගෙනුම් ආධාරක සැකසීමත් සිදු කරන ලදී. ඒ අනුව ගුරු වෘත්තිය සංවර්ධනය සහ අධීක්ෂණය (Teacher Development in Supervision) - ELP1105 සහ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ක්‍රමවේදය (Technology in ELT) - ELP1103 යන විෂයන් හඳුන්වා දෙන ලදී. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ක්‍රමවේදය (Technology in ELT) - ELP1103 විෂය ශිෂ්‍යන්ට සැප්තැම්බර් - දෙසැම්බර් කාලය තුළ මාර්ගගත (Online) තාක්ෂණය ඔස්සේ සැපයිණි.

(ග) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් 2013 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා ප්‍රධාන පාඨමාලාවලට අදාළ විෂයන් සහ කෙටි කාලීන පාඨමාලා ඇගයීම සම්බන්ධයෙන් සිසුන්ගේ ප්‍රතිපෝෂණය ලබා ගැනීමේ ප්‍රශ්නාවලියක් සැලසුම් කිරීමත් ඒ පිළිබඳව මෙහෙයවීම් කිරීමත් සිදුවිය.

(ඝ) නව තාක්ෂණය භාවිත කරමින් ප්‍රථම වරට කැනඩාවේ පදිංචි සිසුන් දෙදෙනෙකුට අදාළ අවසන් වාචික පරීක්ෂණයන් (Viva-voce examinations) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් සිදු කළ හැකිවිය. මෙම උත්සාහය සාර්ථක විය. ප්‍රමාණවත් පහසුකම් සහිතව ඉදි කෙරෙන අලුත් ගොඩනැඟිල්ලේ නව තාක්ෂණ පහසුකම් මඟින් ශිෂ්‍යන්ගේ අධ්‍යයන අවශ්‍යතා ජාත්‍යන්තර මට්ටමෙන් කිරීම අවශ්‍ය බව තහවුරු විය. මේ මඟින් ව්‍යවහාරික වාග්විද්‍යාව විෂය ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර ප්‍රවණතාවන් පිළිබඳ අධ්‍යයනය කිරීමට ශිෂ්‍යයන්හට අවස්ථාව ලැබෙනු ඇත. ජාත්‍යන්තර අධ්‍යයන ප්‍රවීණයන් මඟින් මේවා අධීක්ෂණය කෙරේ. මෙම පහසුකම් විශේෂයෙන්ම පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන කාර්යයන් සඳහා සහභාගීවීමට භූගෝලීය වශයෙන් බාධා පවතින ශිෂ්‍යයන් සඳහා මහෝපකාරීවෙයි.

(ච) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යක්ෂ බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී ත්‍රෛභාෂීය ශ්‍රී ලංකා ව්‍යාපෘතිය යටතේ

අධ්‍යාපන නිලධාරීන් සඳහා ඉංග්‍රීසි භාෂා කුසලතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුවක් පැවැත්වූවා ය.

(ජ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යක්ෂ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය ජාතික අධ්‍යාපන ආයතනයේ ද්විභාෂීය අධ්‍යාපනය පිළිබඳ ක්‍රමෝපාය පත්‍රිකාවක් සැකසීම පිළිබඳ දායකත්වය සැපයූහ.

(ඣ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශිෂ්‍යයන් තිස්පස් දෙනෙක් (35) ලියාපදිංචි කරන ලදී. ශිෂ්‍යයන් අසූහතර (84) දෙනෙක් බඳවා ගැනීමේ විභාගයට පෙනී සිටිය නමුත් හැට නව (69) දෙනෙක් පමණක් ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලැබූහ. පසුගිය වසර සමඟ සසඳා බැලීමේ දී අයදුම්කරුවන්ගේ ක්‍රියාකාරීත්වය සතුටුදායක නොවීය. ඔවුන්ගේ භාෂා කුසලතා විචාරාත්මක චින්තන හැකියාව සහ විෂයානුබද්ධ දැනුම අඩුබව පෙනී ගියේය. මෙම අඩුව පුරවනු වස් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් අධ්‍යයන සන්නිවේදන කුසලතා පාඨමාලාව (Academic Communication Skills) ආරම්භ කරන ලදී.

(ඤ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ සිසුන් පස් දෙනෙක් සඳහා උපදේශකත්වය සැපයීමත් විභාගයට ලක් කිරීමත් සිදුවිය.

(ට) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ පර්යේෂණ මට්ටමේ සිටින ශිෂ්‍යයන් එකොළසකගේ (11) උපදේශන කටයුතු සිදු කෙරිණි. කෙසේ හෝ ව්‍යවහාරික වාග්විද්‍යාව පිළිබඳ විශේෂිත වූ දැනුම සහිත ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන්ගේ හිඟය නිසා පශ්චාද් උපාධි මට්ටමේ පර්යේෂණ කටයුතු උපදේශනය බරපතල ගැටලුවක් වූ අතර ඒ බර අධ්‍යක්ෂ සහ භාෂා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු තිදෙනෙක් මත පැවරිණි.

**යටිතල පහසුකම් ප්‍රගතිය**

2013 ජූනි මස දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ගොඩනැඟිල්ල සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. ඒ අනුව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සිව්මහල් ගොඩනැඟිල්ලක් සඳහා සැලසුම් සකසන ලදී. දේශන ශාලා, පන්ති කාමර, සාකච්ඡා සඳහා ඉඩ පහසුකම්, මාර්ගගත අධ්‍යාපන පහසුකම්, ස්කයිප් වැනි මාධ්‍ය සහ අනෙකුත් තාක්ෂණයන් ඔස්සේ අධ්‍යයන පහසුකම්, පරිපාලනමය සහ අධ්‍යයන

කාර්ය මණ්ඩලය සඳහා ඉඩ පහසුකම් මෙම නව ගොඩනැගිල්ලේ අන්තර්ගත වෙයි. මේ සඳහා කැබිනට් මණ්ඩලය රු. මිලියන 93 ක මුදලක් අනුමත කොට තිබුණි.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් 2013 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කෙරිණි.

| දිනය | කාර්යය |
|---|---|
| 2013.02.13 | වර්ග මීටරයක් සඳහා වන වියදම් ඇස්තමේන්තුව පිළිබඳ පැහැදිලි කිරීමක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මඟින් යවන ලදී. |
| 2013.04.26 | යෝජිත ගොඩනැගිල්ල සඳහා මූල්‍ය සැලසුම (Financial Plan) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයෙන් ඉල්ලා සිටින ලදී. |
| 2013.05.07 | ගොඩනැගිලි ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීම. |
| 2013.07.03 | පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත ලබා දෙන ලද බිම් කොටස සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභා අනුමැතිය ලබා දිම. |
| 2013.07.17 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය නියෝජනය කරන තාක්ෂණ ඇගයීමේ කමිටු සාමාජිකයන් (TEC members) නම් කොට යැවීම. |
| 2013.07.18 | පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත ලබා දෙන බිම් කොටස මැනීම සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීමක් කිරීම. |
| 2013.07.29 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තාක්ෂණ ඇගයීමේ කමිටු (අමාත්‍ය මණ්ඩල තාක්ෂණ ඇගයීමේ කමිටුව ද ඇතුළුව) පත් කිරීම. |
| 2013.07.30 | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් මැනුම් නියෝගය දන්වා එවීම. |
| 2013.08.07 | ටෙන්ඩර් පත්‍රිකා සැකසීම පිළිබඳව තාක්ෂණ ඇගයීම් කමිටු රැස්වීමක් කැඳවීම. |
| 2013.08.13 | ටෙන්ඩර් පත්‍රිකා සැකසීම සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුව රැස්වීම. |
| 2013.08.28 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ටෙන්ඩර් පත්‍රිකා ලිපි ලේඛන බාර දීම. |

| | |
|---|---|
| 2013.09.03 | මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් බිම් කොටස මැනීම සිදු කිරීම. |
| 2013.09.18 | ටෙන්ඩර් පත්‍රිකා අනුමත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව (MPC) රැස්වීම. |
| 2013.09.20 | නම් කරන ලද ආයතනයන්ගෙන් අධ්‍යක්ෂ/ප්‍රසම්පාදන - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ටෙන්ඩර් කැඳවීම. |
| 2013.10.08 | පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ඉදිකිරීම් ආයතන සමඟ පූර්ව ටෙන්ඩර් පත්‍රිකා බාර දීම සඳහා වන අවසන් දිනය. |
| 2013.11.15 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය වෙත ටෙන්ඩර් පත්‍රිකා බාර දීම සඳහා වන අවසන් දිනය. |
| 2013.12.02 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ටෙන්ඩර් පත්‍රිකා තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත බාර දීම. |

## 2012/2013 වර්ෂයේ ශිෂ්‍ය ක්‍රියාකාරීත්වය

වගුව - 01

**2012/2013 අවසන් ඇගැයීම් සම්බන්ධයෙන් ශිෂ්‍ය ක්‍රියාකාරිත්වය**

| | ELM 1301 | ELM 1201 | ELM 1202 | ELM 1203 | ELM 1101 | ELM 1102 | ELM 1104 | ELM 2101 | ELM 2102 |
|---|---|---|---|---|---|---|---|---|---|
| විභාගයට පෙනී සිටි මුළු ගණන | 11 | 23 | 20 | 25 | 32 | 15 | 32 | 13 | 13 |
| සමත් වූ ගණන | 11 | 23 | 20 | 25 | 32 | 15 | 32 | 12 | 13 |
| අසමත් වූ ප්‍රතිශතය | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (0%) | 01 (77%) | 0 (0%) |

## පර්යේෂණ

ශිෂ්‍යයන් විසින් තම පර්යේෂණ ඉදිරිපත් කරනු ලබන පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වාර්ෂික පර්යේෂණ සැසිය 2013 මාර්තු මස දී පැවැත්විණි. විශ්වවිද්‍යාල බොහොමයක (කොළඹ විශ්වවිද්‍යාලය, කැළණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ යාපනය විශ්වවිද්‍යාලය) විද්‍යාර්ථීහු මේ සඳහා සහභාගී වූ අතර පර්යේෂණ ව්‍යාපෘතිවල සහ ඉදිරිපත් කිරීම්වල (Presentations) ගුණාත්මක බව පිළිබඳව ප්‍රශංසනාත්මකව ඇගැයූහ.

පහත සඳහන් මාතෘකා පර්යේෂණයන්හි දී ඉදිරිපත් විය.

- ✓ A lexical analysis of language in chemistry : complitation of an academic corpus for Sri Lankan science undergradauates.
- ✓ The effectiveness of using cooperative learning as the sole method of teaching/learning in an adult, low-proficiency of topis classroom.
- ✓ Effectiveness of topic-based writing tasks in developing $L_2$ reading 'text' comprehension.
- ✓ Effectiveness of a CALLA based English language curriculum on development of academic language proficiency of second language lerners.
- ✓ An evaluation of collaborative writing on composition writing 'tasks' an ESL secondary level Sri Lankan context.
- ✓ Promoting leraner autonomy among the teacher trainees of Pasdunrata National Collage of Education.

අධ්‍යක්ෂ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාජිකයන් දෙදෙනෙක් පිලිපීනයේ මැනිලා නුවර පැවති ASIA TEFL ජාත්‍යන්තර සමුළුවේ දී තම පර්යේෂණ ඉදිරිපත් කළහ. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යක්ෂකගේ ඉදිරිපත් කිරීම විශේෂාංග ඉදිරිපත් කිරීමක් (Featured Presentation) විය.

ඉන්දියාවේ ඇසෑම් හි BTAD Kokrajhar හි දී ICSSR අනුග්‍රහයෙන් පැවති ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් සඳහා "Globalisation to Glocalisation" පිළිබඳව ඉදිරිපත් කිරීමක් එක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විසින් සිදු කරන ලදී.

**නව වැඩ සටහන් හා පාඨමාලා**

දර්ශනපති (Master of Philosophy) උපාධිය මඟින් දර්ශනසූරි (Doctor of Philosophy) උපාධිය සඳහා වන යෝජනාවලිය සැකසිණි.

ඉංග්‍රීසි ගුරුවරුන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පරීක්ෂණ හා ඇගැයීම (Testing and Evaluation in ELT) විෂය ක්ෂේත්‍රයට අදාළ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලාවක් සැකසීම සඳහා යෝජනාවලියක් සැකසීම, විෂය මාලාව සහ පාඩම් මාලා සැකසීම සිදු කෙරිණි.

ශ්‍රී ලංකා විෂය නිර්දේශයට අදාළව අ.පො.ස උසස් පෙළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම සිදු කරන ඉංග්‍රීසි ගුරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලාවක් සැකසීම සඳහා යෝජනාවලියක් සැකසීම, විෂය මාලාව සහ පාඩම් මාලා සැකසීම සිදු කෙරිණි.

ගුරු සංවර්ධන හා ඇගැයීම (Teacher Development and Supervision – ELP1105) විෂය (තෝරා ගත හැකි) සඳහා විෂය නිර්දේශය සහ ඉගෙනුම් ආධාරක සැකසීම සිදු කෙරිණි.

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ක්‍රමවේදය (Technology in ELT – ELP1103) විෂයට අදාළව විෂය නිර්දේශය සහ ඉගෙනුම් ආධාරක සැකසීම සිදු කෙරිණි.

**කාර්ය මණ්ඩලය**

2013 වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ පරිපාලන සහායක කාර්ය මණ්ඩලය බඳවා ගන්නා ලදී. අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සාමාජිකයන් දෙදෙනෙකු බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමත් බඳවා ගැනීමත් සිදු කෙරිණි. (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සහ කථිකාචාර්ය ආධුනික - තනතුර සඳහා) මෙම බඳවා ගැනීම් පිළිවෙළින් මැයි සහ ජූනි මාසවල දී සිදු විය.

එච්.ඩී. විජේසේකර මිය 2013 මැයි මස 06 දින ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුරෙහි වැඩ බාරගත් අතර එම්.අයි. ජැන්ස් මිය 2013 ජූනි මස 03 වෙනි දින කථිකාචාර්ය (ආධුනික) තනතුරෙහි වැඩ බාරගත්තාය.

ඒ අනුව ආයතනයේ සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් ගණන තිදෙනෙක් දක්වා වර්ධනය විය.

එසේම පොත් තබන්නා තනතුර (II ශ්‍රේණිය - 'ආ' කාණ්ඩය) සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමත් බඳවා ගැනීමත් පරිගණක යෙදවුම් සහකාර (III ශ්‍රේණිය) සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමත් බඳවා ගැනීමත් සිදුවිය. පොත් තබන්නා තනතුර සඳහා මූලිකව අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවන ලද අතර (විශ්වවිද්‍යාල පද්ධතිය තුළින්) එක් අයදුම්පතක් පමණක් ලැබුණි. ඒ අනුව ලිඛිත පරීක්ෂණයක් පවත්වන ලද අතර පෙනී සිටි අයදුම්කරුගේ කුසලතා මට්ටම සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමට තරම් ප්‍රමාණවත් නොවන බව වාර්තා විය. ඒ අනුව විවෘත අයදුම්පත් කැඳවීම සිදු කරන ලදී. ඒ අනුව 2012.11.16 දින "දිනමිණ" පුවත්පතේ දැන්වීමක් පළ කරන ලද අතර අයදුම්පත් 201 ක් ලැබුණු අතර 124 දෙනෙක් පමණක් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා සිටියහ. ඒ

අනුව 64 දෙනෙක් විභාගයට පෙනී සිටි අතර එයින් 06 දෙනෙක් සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසුකම් ලැබූහ.

ඒ අනුව මෙම තනතුර 2013.04.30 දින පුරවන ලදී. ඒ.ආර්.එස්.කේ. රාජපක්ෂ මෙණෙවිය (තෝරා ගන්නා ලද අයදුම්කරු) 2013.04.30 දින පොත් තබන්නා තනතුරෙහි වැඩ බාරගත්තාය.

2013.07.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යාල කම්කරු එම්.එච්.පී.එච්. ජයවර්ධන මයා කළමනාකරණ මණ්ඩල නිර්දේශය පරිදි අනිවාර්ය නිවාඩු යවන ලදී. එක් කම්කරු තනතුරක් පමණක් පවත්නා හෙයින් කළමනාකරණ මණ්ඩල අනුමැතිය අනුව දෛනික ගෙවීම් පදනම මත පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දෛනික වැඩ කටයුතු ඉටු කරවා ගැනීම සඳහා කම්කරුවෙකු බඳවා ගැනිමට තීරණය කරන ලදී.

ඒ අනුව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නාම ලේඛනයක් ලබා ගන්නා ලද අතර අයදුම්කරුවන් 06 දෙනෙක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවිණි. ඒ අනුව ඩබ්.එම්.ඩී.ආර්.බී. වීරසිංහ මයා තාවකාලික කම්කරු ලෙස 2013.08.01 දින සිට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සේවය සඳහා බඳවා ගන්නා ලදී.

## අධ්‍යයනකරුවන් සඳහා සැපයෙන උපකාර

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන සම්පත් රැස්කර තැබීමේ ස්ථානය ලෙස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාලය පශ්චාද් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවන්හි නිරත ශිෂ්‍යයන්ට පුස්තකාලයීය පහසුකම් සැපයීමේ නිරත විය. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩල සාමාජික ලෙස සේවය සැපයූවාය.

## අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ක්‍රියාකාරකම්

### ආචාර්ය එච්. වී. එම්. රත්වත්ත මිය, අධ්‍යක්ෂ

Asia TEFL සංගමයේ විධායක කමිටු සාමාජික ලෙස ක්‍රියා කිරීම

Asia TEFL සඟරාවෙහි සංස්කාරක උපදේශන මණ්ඩල සාමාජික

Asia TEFL ශ්‍රී ලාංකේය නියෝජනය

විශේෂාංග සංදර්ශක - Asia TEFL ජාත්‍යන්තර සමුළුව, මැනිලා, පිලිපීනය

සාමාජික - සංස්කාරක උපදේශන මණ්ඩලය, ආසියානු TEFL සඟරාව, සියොල් කොරියාව

සාමාජික - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ තත්ත්ව පරීක්ෂණ කමිටුව (Quality Assurance Committee)

විශ්ලේෂක - ජාතික අධ්‍යාපන ආයතනයේ ද්විභාෂාමය ගුරුවරුන් සඳහා අධ්‍යයන සම්පත් සැකසීම

ඇගයුම්කරු - ජාතික අධ්‍යාපන ආයතනයේ ද්විභාෂීය ගුරුවරුන් සඳහා ක්‍රමවිද්‍යාව පිළිබඳ සම්පත් සැකසීම

සම්පත් දායක - ජාතික අධ්‍යාපන ආයතනයේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ ක්‍රමෝපාය සැලසුම් ලේඛනයක් සැකසීම පිළිබඳ වැඩමුළුව

සම්පත් දායක - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) පර්යේෂණ සම්පාදක කුසලතා

අත්පිටපත් විශ්ලේෂක - පාකිස්ථානයේ ඉංග්‍රීසි අධ්‍යයනය පිළිබඳ ලාහෝර් ආයතන සඟරාව

සාමාජික - අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පද්ධතිය තුළ ඉංග්‍රීසි කථනය සහ ජාතික විභාග පද්ධතිය යන අංගයන් අභිව්‍යක්ත කිරීම පිළිබඳ උපදේශන සභාව

ප්‍රධාන සංස්කාරක - විස්ටාස් (Vistas) සඟරාව, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

සම්පත් දායක - ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සැකසීම යටතේ ජාතික සංවර්ධනය ද්විභාෂා අධ්‍යාපන පිළිබඳ වැඩමුළුව

ප්‍රධාන දේශක - බෝධිමඟ පදනම, කළුතර - ආත්ම අභිවෘද්ධිය සඳහා ඉංග්‍රීසි භාෂාවේ කාර්ය භාරය

සාමාජික - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉංග්‍රීසි පිළිබඳ ස්ථාවර කමිටුව

මූලික උපදේශනය - උසස් අධ්‍යාපනය පිළිබඳ කමිටුව

විශ්ලේෂක - කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨයේ සඟරාව 2-වෙළුම

කර්තෘ මණ්ඩල සාමාජික - ජාතික අධ්‍යාපන ආයතනයේ ද්විභාෂා අධ්‍යාපන සඟරාව

උපාධි නිබන්ධ පරීක්ෂක - කැලණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය

උපාධි නිබන්ධ පරීක්ෂක - කොළඹ විශ්වවිද්‍යාලයේ දර්ශනපති (MPhil) උපාධිය

උපාධි නිබන්ධ පරීක්ෂක - දර්ශනසූරි උපාධිය, අන්නා විශ්වවිද්‍යාලය, ඉන්දියාව

සභාපති - ඇගයුම් කමිටුව - ත්‍රිකුණාමල මණ්ඩපයේ භාෂා විෂයමාලාව සැකසීම

සම්පත් දායක - අධ්‍යාපන නිලධාරීන්ගේ ඉංග්‍රීසි භාෂා හැකියාව වර්ධනය කිරීමේ වැඩමුළුව - UNV-UNESCO, BCIS, MOE සහ PTFTSL ආයතනයන්හි අනුග්‍රහයෙන් සංවිධානය කරන ලද

**ආචාර්ය එච්.එස්. රඹුක්වැල්ල මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

ඇගැයුම් කමිටු සාමාජික - ත්‍රිකුණාමල මණ්ඩපයේ භාෂා විෂයමාලා සම්පාදනය

භාරකාර මණ්ඩල සාමාජික - The Gration Trust පදනම

විනිශ්චය මණ්ඩල සාමාජික - (අවසන් වටය) 2013 ස්වර්ණ පුස්තක සම්මානය, ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමය මඟින් සංවිධානය කරන ලද

සම්පත් දායක - බ්‍රිතාන්‍ය කවුන්සිලය, අ.පො.ස - උ.පෙළ සාහිත්‍ය වැඩමුළුව

මූලික විෂය අධ්‍යක්ෂ - "විවිධත්වය සහ ව්‍යාතිරේඛයන්" යන මැයෙන් කොළඹ - ජාත්‍යන්තර ජනවාර්ගික අධ්‍යයන මධ්‍යස්ථානයේ පැවති උපාධිධාරී සමුළුවේ පවත්වන ලද දේශනය

ශ්‍රී ලාංකේය නියෝජනය - බ්‍රිතාන්‍ය කවුන්සිලය මඟින් සංවිධානය කරන ලද දකුණු ආසියා උසස් අධ්‍යාපන සංවාද - ඩුබායිහි එක්සත් අරාබි එමීර් රාජ්‍යය

### එච්.ඩී. විජේසේකර මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

ඇගැයුම් කමිටු සාමාජික - ත්‍රිකුණාමල මණ්ඩපයේ භාෂා විෂයමාලා සම්පාදනය

විශේෂාංග සංදර්ශක - Asia TEFL ජාත්‍යන්තර සමුළුව, මැනිලා, පිලිපීනය

### එම්.අයි. ජැන්ස් මිය, කථිකාචාර්ය

ප්‍රධාන ආරාධිත - ඉංග්‍රීසි දින උත්සවය - ආවේ මරියා බාලිකා විද්‍යාලය

සංදර්ශක - Asia TEFL ජාත්‍යන්තර සමුළුව, මැනිලා, පිලිපීනය

සම්පත් දායක - මොරටුව විශ්වවිද්‍යාලයේ, HETC ව්‍යාපෘතිය

ඇගැයුම් කමිටු සාමාජික - ත්‍රිකුණාමල මණ්ඩපයේ භාෂා විෂයමාලා සම්පාදනය

### සහයෝගය සහ සංයෝගය

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා එහි කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් මෙහෙයවන ලද වැඩමුළු සඳහා අප ආයතනය අධ්‍යයන සංයෝගය සැපයීය. එසේම පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශය සහ අධ්‍යාපන පීඨය යන ආයතනයන්ට ද ඉගෙනුම් හා ඇගැයුම් කාර්යන්හි දී සහයෝගය සපයන ලදී.

භාෂා අධ්‍යයනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සියලු කාර්යයන්හි දී සංයෝගය සැපයීම සුපුරුදු පරිදි සිදු කළහ. පශ්චාද් උපාධි මට්ටමේ සිසුන් සඳහා උපදේශකත්වය මෙම සහයෝගය නොලැබෙන්නට අසීරු කාර්යයක් වනු ඇත. එසේ වන්නේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සතුව අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුම සහිත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති බැවිනි.

2013 වර්ෂය තුළ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා සහයෝගය ලබා දීම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ බොහෝ දෙනෙකු විසින් සිදු කරන ලදී. මේ අතර උපකුලපතිතුමා, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාව, නියෝජ්‍ය

උපකුලපතිතුමා, ලේඛකාධිකාරීතුමිය, මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ සහ අධ්‍යාපන පීඨයේ පීඨාධිපතිවරු, මූල්‍යාධිකාරීතුමා, පුස්තකාලයාධිපතිනිය ඇතුළු කාර්ය මණ්ඩලය, අධ්‍යාපන පීඨයේ සහාකාර ලේඛකාධිකාරී ඇතුළු කාර්ය මණ්ඩලය, අධ්‍යාපන තාක්ෂණ අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය යනාදීහු වෙති. වාර්ෂික වාර්තාව දෙමළ බසට පරිවර්තනය කරවා ගැනීමේ කාර්යය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ටී. තනරාජ් මහත්මා විසින් ඉටු කර දෙන ලදී.

ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ එක් එක් විෂය සඳහා අවශ්‍ය සහයෝගය සේවාර්පිත මහාචාර්ය ආර්. රහීම් මෙණෙවිය, බී. කේ. පී අබේසූරිය මිය, ආචාර්ය රධිකා ද සිල්වා මිය, ආචාර්ය වි. වැ. මැදවත්තේගෙදර මිය, ආචාර්ය දිනලි දේවේන්ද්‍ර මිය, එල්. කේ. කුමාරණතුංග මිය (ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි අංශයේ හිටපු අධ්‍යක්ෂ), යාපනය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එම්. කේ. එස්. අයියර් මහතා, කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය සී. ඩී. එස්. වැත්තෑව මිය සහ ඩිනලි ඉන්දිරා ප්‍රනාන්දු මිය සහ විජිතා යටවත්ත මිය (ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි අංශයේ හිටපු අධ්‍යක්ෂ), ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සමාජීයවිද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එල්. ඩී. අයි. විජේතුංග මහතා, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පාලිත දිසානායක මහතා, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ටී. තනරාජ් මහතා යන අය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ආරාධිත දේශකයන් ලෙස කටයුතු කරමින් සහයෝගය ලබා දුන්හ.

මෙම වර්ෂය තුළ දී පසුගිය වර්ෂයන්හි දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කරන ලද එස්.ජේ. ගුණවර්ධන මයා (මොරටුව විශ්වවිද්‍යාලය) සහ එස්.ආර්. ඉලංගකෝන් මිය (කොළඹ විශ්වවිද්‍යාලය) යන විද්වතුන් ද අධ්‍යයන ඇගැයීමේ කාර්යාවලියේ දී සහයෝගය සැපයූහ.

කොළඹ විශ්වවිද්‍යාලයේ සේවාර්පිත මහාචාර්ය ශිරෝමි ප්‍රනාන්දු මහත්මිය, ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි අංශයේ හිටපු අධ්‍යක්ෂ විජිතා යටවත්ත මිය, කැලණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහීෂි රණවීර මිය සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩිනලි ඉන්දිරා ප්‍රනාන්දු මිය අප ආයතනය සඳහා බාහිර පරීක්ෂකවරු ලෙස සේවය සැපයූහ.

මහාචාර්ය ආර්. රහීම් මෙණෙවිය (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සේවාර්පිත මහාචාර්ය සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ හිටපු අධ්‍යක්ෂ), ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ ආචාර්ය වි. වැ. මැදවත්තේගෙදර මිය, ආචාර්ය දිනලි දේවේන්ද්‍ර මිය සහ ආචාර්ය රධිකා ද සිල්වා මිය උපාධි නිබන්ධ අභ්‍යන්තර

පරීක්ෂකවරු ලෙස කටයුතු කරමින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත සහයෝගය ලබා දුන්හ.

ආචාර්ය දිනලි දේවේන්ද්‍ර මිය (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශය) සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මාධ්‍ය ඒකකයේ අධ්‍යයන අංශ ප්‍රධාන ආචාර්ය ගයත්‍රි ජයතිලක පාඨමාලා සම්පාදක මණ්ඩලයේ සාමාජිකයන් සඳහා ලේඛනකරණය පිළිබඳ වැඩමුළුව සඳහා සම්පත් දායකයන් ලෙස සහයෝගය ලබා දුන්හ. ආචාර්ය දේවේන්ද්‍ර මිය පාඨමාලා සම්පාදක කණ්ඩායම් සාමාජිකාවක ලෙස ද (දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ) කටයුතු කළාය. ආචාර්ය සුමති සිවමෝහන් (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය), ආචාර්ය වි. වැ. මැදවත්තේගෙදර මිය, ආචාර්ය කේ. වර්ණපාල මිය (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශය), ඩිනලි ඉන්දිරා ප්‍රනාන්දු මිය (කැලණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශය), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රුහනි පෙරේරා මිය, ආර්.ඒ.ඒ. රණවීර මහතා, කමලා විජේරත්න මිය, ලාල් මැදවත්තේගෙදර මයා (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ කථිකාචාර්ය), සුනිලා ගලප්පත්ති මිය, ට්‍රේසි හෝල්සිගර් මිය, රුක්ෂාන් ඊබ්‍රාහිම් මිය යන විද්වත්හු වැඩමුළු සඳහා සහභාගි වෙමින්, පාඨමාලා කණ්ඩායම් සාමාජිකයන් ලෙස වගකීමෙන් කටයුතු කරමින් සහ ලේඛක මණ්ඩලය ලෙස සහ සංස්කාරක මණ්ඩලය ලෙස කටයුතු කරමින් සහයෝගය ලබා දුන්හ.

අයිරා උනම්බුව මිය මාර්ගගත සම්පත් භාවිතය පිළිබඳව පර්යේෂණ සිසුන් දැනුවත් කිරීම සඳහා වැඩමුළුවක් පවත්වමින් සම්පත් දායකයෙකු ලෙස සහයෝගය සැපයූවාය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ අනෙකුත් ජාතික විශ්වවිද්‍යාලයන්හි අධ්‍යයන හා අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් ලැබුණු සහයෝගය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ඉමහත් ගෞරවයෙන් යුතුව සිහිපත් කරන්නෙමු. මෙවන් සහයෝගයක් නොලැබුනේ නම් අප ආයතනය ක්‍රියාත්මක මට්ටමේ නොපවතිනු ඇත.

මෙම සහයෝගය මඟින් ප්‍රත්‍යක්ෂ කෙරෙනුයේ ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන් පශ්චාද් උපාධි අධ්‍යයන මට්ටමේ දී පවත්වා ගෙන යනු ලබන බවයි.

## 6. සංශෝධිත මූල්‍ය ප්‍රකාශය (නව ආකෘතිය අනුව)

### (අ) පුනරාවර්තන වියදම් පිළිබඳ තොරතුරු

| විෂය | 2012 වර්ෂයේ රුපියල් | 2013 වර්ෂයේ රුපියල් |
|---|---|---|
| (අ) පුද්ගල වැටුප් හා වේතන | 4,668,633.49 | 7,854,551.23 |
| (ආ) ගමන් වියදම් | 35,257.60 | 43,987.00 |
| (ඇ) සැපයුම් | 474,141.08 | 638,047.34 |
| (ඈ) නඩත්තු | 25,984.00 | 47,550.00 |
| (ඉ) කොන්ත්‍රාත් සේවා | 774,585.88 | 455,311.04 |
| (ඊ) වෙනත් | 1,009,393.59 | 1,604,017.52 |
| එකතුව | 6,987,995.64 | 101,643,464.13 |

### (ආ) ප්‍රාග්ධන වියදම් පිළිබඳ තොරතුරු

| විෂය | 2012 වර්ෂයේ රුපියල් | 2013 වර්ෂයේ රුපියල් |
|---|---|---|
| (අ) ගෘහ උපකරණ හා කාර්යාලයීය උපකරණ අත්පත් කර ගැනීම. | 1,051,982.00 | 177,429.00 |
| (ආ) යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම | - | 748,989.51 |
| (ඇ) ගොඩනැගිලි හා සැලසුම් අත්පත් කර ගැනීම | - | 204,250.00 |
| (ඈ) වෙනත් | 272,415.09 | 137,243,30 |
| එකතුව | 1,324,397.09 | 1,267,912.21 |

### (ඇ) මූල්‍ය ප්‍රගතිය (වියදම්) පිළිබඳ තොරතුරු

| විෂය | 2013 වර්ෂයේ ප්‍රතිපාදන රු. | 2014 වර්ෂයේ වියදම රු. | ඉතිරිය/හිඟය රු. |
|---|---|---|---|
| (අ) ව්‍යාපෘති හැර පුනරාවර්තන | 11,851,000.00 | 10,643,464.13 | 1,207,535.87 |
| (ආ) ව්‍යාපෘති හැර ප්‍රාග්ධන | 4,401,000.00 | 1,267,912.21 | 3,133,087.79 |
| (ඇ) ව්‍යාපෘති - දේශීය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක | - | - | - |
| (ඈ) ව්‍යාපෘති - විදේශීය ආධාර මත ක්‍රියාත්මක | - | - | - |
| එකතුව | 16,252,000.00 | 11,911,376.34 | 4,340,623.66 |

## (ඇ) මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (උපයන ලද ආදායම්)

| ආදායම් ප්‍රභවය | 2013 වර්ෂයේ ප්‍රතිපාදන රු. | 2013 වර්ෂයේ එකතුව රු. | අතිරික්තය/හිඟය |
|---|---|---|---|
| (අ) ප්‍රථම උපාධි අධ්‍යයන | - | - | - |
| (ආ) පශ්චාද් උපාධි අධ්‍යයන | 2,337,000.00 | 3,126,893.00 | (789,893.00) |
| (ඇ) උපදේශක සේවා | - | - | - |
| (ඈ) වෙනත් | 297,000.00 | 1,730,504.56 | (1,433,504.56) |
| එකතුව | 2,634,000.00 | 4,857,397.56 | (2,223,397.56) |

## (ඉ) මූල්‍ය ක්‍රියාකාරීත්ව විශ්ලේෂණය - 2013

| විෂය | විග්‍රහය | ඒක ශිෂ්‍ය පිරිවැය රු. |
|---|---|---|
| (අ) ඒක ශිෂ්‍ය පුනරාවර්තන පිරිවැය | පුනරාවර්තන වියදම්/ශිෂ්‍ය සංඛ්‍යාව | 98,550.59 |
| (ආ) ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන පිරිවැය | ප්‍රාග්ධන වියදම්/ශිෂ්‍ය සංඛ්‍යාව | 11,739.93 |
| එකතුව | | 100,149.03 |

## 7 . විගණන කමිටු වාර්තාව

### අභ්‍යන්තර විගණන වාර්තාව

අභ්‍යන්තර විගණන අංශය විසින් සලකා බලන ලද වර්ෂයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සලකා බැලිය යුතු අංශයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳව විගණනය සිදු කරන ලදී. පහත සඳහන් අංශයන්ට අදාළව මේ පිළිබඳ කරුණු පෙළ ගැසීම සිදු කෙරේ.

1. පූර්ව විගණන
   - විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම
   - පාරිතෝෂික ගෙවීම්
   - විශ්‍රාම අරමුදලේ මුදල් නිදහස් කිරීම
   - කොන්ත්‍රාත් මත අවසන් ගෙවීම් සහ රැඳවුම් මුදල් නිදහස් කිරීම

2. සත්‍යාපනය
   - වාර්ෂික තොග සමීක්ෂණය - ප්‍රධාන ගබඩාව 2013.12.31 දිනට

3. අනාවරණය කරන ලද විගණන විමසුම් මඟින් සොයා බලන ලද කරුණු 2013
   - පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීමට අදාළ සත්‍යාපනය
   - පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනුවලට අදාළ සත්‍යාපනය

4. විගණන කමිටුව

   ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ විගණන කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් බැගින් රැස්වන අතර එමගින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යාවලිය විමර්ෂණය කෙරේ.

   කමිටුව විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ අභ්‍යන්තර විගණන අංශයෙන් මතු කරන ලද විගණන වාර්තා හා විමසුම් සහ ඒවාට අදාළව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය හා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් සපයනු ලැබ ඇති පිළිතුරු සලකා බලයි. එසේම කමිටුව නිර්දේශයන් ඉදිරිපත් කිරීම ද නිවැරදි ක්‍රියාමාර්ගයන් පිළිබඳ උපදෙස් ලබා දීම ද අධීක්ෂණය කිරීම ද සිදු කරයි.

   සලකා බලන වර්ෂය තුළ විගණන කමිටුව අවස්ථා හතක (07) දී රැස් වී ඇත.

5. කාර්ය මණ්ඩලය

   අභ්‍යන්තර විගණන අංශය පහත සඳහන් කාර්ය මණ්ඩලයෙන් සමන්විත වෙයි.
   - සහකාර අභ්‍යන්තර විගණක
   - විගණක සහකාර
   - ලිපිකරුවෙක්
   - පරිගණක යෙදවුම් සහකාර
   - කම්කරුවෙක්

8. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

PGIE
POST GRADUATE INSTITUTE OF ENGLISH

# පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

# මූල්‍ය වාර්තාව

# 2013

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
## 2013.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2013 (රු) | 2012 (රු) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| බැංකුවේ අතැති මුදල් | 1 | 3,590,475.34 | 738,530.09 |
| සේවක ණය හා අත්තිකාරම් | 2 | 504,965.00 | 380,965.00 |
| ශිෂ්‍යයන්ගෙන් ලැබිය යුතු දෑ | 3 | 912,962.00 | 289,977.00 |
| කෙටි කාලීන ආයෝජන | 4 | 11,041,856.05 | 8,027,257.55 |
| තොග | | 167,108.00 | 118,164.99 |
| කලින් ගෙවීම් සහ ලැබිය යුතු දෑ | 5 | 156,643.45 | 119,080.52 |
| | | 16,374,009.84 | 9,673,975.15 |
| **ජංගම නොවන වත්කම්** | 6 | | |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | | 432,723.89 | 353,932.55 |
| කාර්යාල උපකරණ | | 667,234.20 | 974,242.40 |
| පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන | | 841,285.44 | 951,650.43 |
| පරිගණක හා උපාංග | | 1,292,253.13 | 866,587.56 |
| පා පැදිය | | 10,700.00 | - |
| ඉඩම් හා ගොඩනැගිලි - කෙරීගෙන යන වැඩ | | 204,250.00 | - |
| | | 3,448,446.66 | 3,146,412.94 |
| මුළු වත්කම් | | 19,822,456.50 | 12,820,388.09 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 7 | 664,070.60 | 661,401.39 |
| විවෘත විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු ශේෂය | | 58,550.97 | 8,195.14 |
| විවිධ ණයහිමියෝ | 8 | 15,792.00 | 15,792.00 |
| ශිෂ්‍ය ගාස්තු කලින් ලැබීම් | 9 | 1,457,768.00 | 1,565,526.00 |
| | | 2,196,181.57 | 2,250,914.53 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 10 | 513,215.00 | 428,810.00 |
| මුළු වගකීම් | | 2,709,396.57 | 2,679,724.53 |
| **ශුද්ධ වත්කම්** | | **17,113,059.93** | **10,140,663.56** |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | |
| වැය කළ මූලධන ප්‍රතිපාදන | 11 | 2,970,719.14 | 2,566,252.94 |
| වැය නොකළ මූලධන ප්‍රතිපාදන | 12 | 3,225,092.23 | 77,504.93 |
| ප.උ.ඉ.භා. ආයතන සංවර්ධන අරමුදල | | 3,973,784.95 | 3,959,285.43 |
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා අරමුදල | | 6,943,463.61 | 3,537,620.26 |
| මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය | | **17,113,059.93** | **10,140,663.56** |

| | | |
|---|---|---|
| ආචාර්ය. එච්.වී.එම්. රත්වත්ත | එල්.එම්.සී. සිරිවර්ධන | කේ.ජේ.එම්. නන්දන |
| අධ්‍යක්ෂ | ජ්‍යෙ. සහකාර ලේඛකාධිකාරී | සහකාර මූල්‍යාධිකාරී |

1

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
## 2013.12.31 දිනත් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්ව පිළිබඳ ප්‍රකාශය

ප්‍රතිප්‍රකාශය

| | සටහන | 2013 (රු) | 2012 (රු) |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රජයේ ආධාර - පුනරාවර්තන වියදම් | | 9,400,000.00 | 6,590,000.00 |
| අයදුම්පත් විකුණුම් ආදායම් | | 102,000.00 | 128,000.00 |
| ශිෂ්‍ය ලියාප | | 62,842.00 | 46,583.00 |
| අධ්‍යයන ගාස්තු | | 2,558,792.00 | 1,323,158.00 |
| විභාග ගාස්තු | | 134,400.00 | 48,000.00 |
| පරිපූරක ගාස්තු | | 48,417.00 | 19,743.00 |
| නිබන්ධන ගාස්තු | | 220,442.00 | 164,503.00 |
| කෙටිකාලීන පාඨමාලා අයදුම්පත් විකුණුම් ආදායම් | | 15,100.00 | 5,000.00 |
| කෙටිකාලීන පාඨමාලා අධ්‍යයන ගාස්තු | | 596,000.00 | 196,800.00 |
| පොලී ආදායම් | 13 | 1,063,161.56 | 708,329.66 |
| විවිධ ලැබීම් | | 56,243.00 | 11,300.00 |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය | | 848,946.50 | 704,844.41 |
| මුළු ආදායම | | **15,106,344.06** | **9,946,261.07** |
| **වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | 14 | 7,854,551.23 | 4,668,633.49 |
| ගමන් වියදම් | 15 | 43,987.00 | 35,257.60 |
| සැපයුම් හා පාරිභෝගික වියදම් | 16 | 638,047.34 | 474,141.08 |
| නඩත්තු වියදම් | 17 | 47,550.00 | 25,984.00 |
| ගිවිසුම්ගත සේවා | 18 | 455,311.04 | 774,585.88 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 19 | 1,604,017.52 | 1,009,393.59 |
| ස්ථාවර වත්කම් ක්ෂය වීම | | 964,978.50 | 704,844.41 |
| පාරිතෝෂික වියදම් | | 84,405.00 | 172,209.50 |
| මුළු වියදම් | | **11,692,847.63** | **7,865,049.55** |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ඌනතාව | | **3,413,496.43** | **2,081,211.52** |

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

(රු)

| | ප.උ.ඉ.භා ආයතනයේ පොදු සංචිතය | වෙනත් අරමුදල් | වැය කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | මුළු වටිනාකම |
|---|---|---|---|---|---|
| 31/12/2011 දිනට ශේෂය | **1,446,516.77** | **3,959,285.43** | **2,526,860.26** | **321,742.00** | **8,254,404.46** |
| පූර්ව වර්ෂ ගැලපීම් | 9,891.97 | - | - | - | 9,891.97 |
| වර්ෂය තුළ වැයකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | - | - | 744,237.09 | (744,237.09) | - |
| වර්ෂය තුළ ලද/(වියදම්කළ) අරමුදල් | - | - | - | 500,000.00 | 500,000.00 |
| ප්‍රාග්ධන අරමුදල් ක්‍රමක්ෂය | - | - | (704,844.41) | - | (704,844.41) |
| කාලච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාව) | 2,081,211.52 | - | - | - | 2,081,211.52 |
| 31/12/2012 දිනට ශේෂය | **3,537,620.26** | **3,959,285.43** | **2,566,252.94** | **77,504.91** | **10,140,663.54** |
| පූර්ව වර්ෂ ගැලපීම් | (7,653.08) | - | - | - | (7,653.08) |
| වර්ෂය තුළ වැය කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | - | - | 1,253,412.70 | (1,253,412.70) | - |
| වර්ෂය තුළ ලද/(වියදම් කළ) අරමුදල් | - | - | - | 4,401,000.00 | 4,401,000.00 |
| ප්‍රාග්ධන අරමුදල් ක්‍රමක්ෂය | - | - | (848,946.50) | - | (848,946.50) |
| ප්‍රදානයන් | | 14,499.52 | | | |
| කාලච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාව) | 3,413,496.43 | - | - | - | 3,413,496.43 |
| 31/12/2013 දිනට ශේෂය | **6,943,463.61** | **3,973,784.95** | **2,970,719.14** | **3,225,092.21** | **17,113,059.91** |

### පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
### 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | 2013<br>(රු) | 2012<br>(රු) |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදනය කළ මුදල් ප්‍රවාහයන්** | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය/(ඌනතාව) | | 3,413,496.43 | 2,081,211.52 |
| කෙටි කාලීන ආයෝජනවලින් ලද පොලී ආදායම | | (1,041,091.45) | (697,077.59) |
| <u>මුදල් නොවන ප්‍රවාහයන්</u> | | | |
| ස්ථාවර වත්කම් ක්ෂය | 964,978.50 | | 704,844.41 |
| පාරිතෝෂික | 84,405.00 | | 172,209.50 |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය | (848,946.50) | | (704,844.41) |
| පූර්ව, වර්ෂයේ උපචිත පොලී ආදායම් ගැලපීම | - | | 17,604.43 |
| වත්කම් ඉවත් කිරීමේ අලාභ | 900.00 | | - |
| පූර්ව වර්ෂ ගැලපීම් | (7,653.08) | 193,683.92 | 9,891.97 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය** | | **2,566,088.90** | **1,583,839.83** |
| **<u>කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම</u>** | | | |
| තොගයේ අඩුවීම/(වැඩිවීම) | (48,943.01) | | (23,204.76) |
| උපචිත වියදම් වැඩිවීම/(අඩුවීම) | (54,732.96) | | 2,202,005.39 |
| උපචිත ආදායම් වැඩිවීම/(අඩුවීම) | (634,054.98) | | (298,977.00) |
| සේවක ණය හා අත්තිකාරම් වැඩිවීම/(අඩුවීම) | (124,000.00) | (861,730.95) | (207,050.00) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | **1,704,357.95** | **1,944,858.42** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| දේපල පිරියත හා උපකරණ මිළදී ගැනීම | (1,126,869.39) | | (1,036,190.00) |
| පොත් හා වාර සඟරා මිළදී ගැනීම | (126,543.30) | | (272,415.09) |
| ඉදිකිරීම් කරුවන්ට ගෙවීම් | - | | (16,776.65) |
| කෙටිකාලීන ආයෝජනවලින් ලද පොලී | - | | 2,541.35 |
| කෙටිකාලීන ආයෝජන ආපසු ගැනීම් | - | | 937,280.46 |
| කෙටිකාලීන ආයෝජන සඳහා යෙදවීම | (2,000,000.00) | | (2,500,000.00) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(3,253,412.69)** | **(2,885,559.93)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන | 4,401,000.00 | | 500,000.00 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **4,401,000.00** | **500,000.00** |
| **මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | **2,851,945.26** | **(440,701.51)** |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | 738,530.09 | 1,179,231.60 |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | **3,590,475.35** | **738,530.09** |

4

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
## 2013 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

**01.** වාර්තා කිරීමේ අස්ථිත්වය

2005 අංක 04 දරන පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන නියමාවලිය යටතේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය පිහිටුවා ඇත. 2006 ඔක්තෝම්බර් 01 දින සිට එහි මෙහෙයුම් ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී. වර්තමානයේ පශ්චාද් උපාධි පාඨමාලා හා කෙටිකාලීන පාඨමාලා පවත්වාගෙන යයි.

**02.** අනුකූලතා ප්‍රකාශය.

රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව උපචිත පදනම සහ ඓතිහාසික පිරිවැය පදනම මත පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මූල්‍ය ප්‍රකාශ අනුකූලව පිළියෙල කර ඇත.

**03.** රජයේ ප්‍රදානයන්

ගිණුම් වර්ෂය තුළ රජයෙන් ලැබුණු මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. 13,801,000.00 වේ. මෙයින් රු. 9,400,000.00 ක් පුනරාවර්තන වියදම් ලෙස හඳුනාගෙන ඇති අතර එය ආදායම් ප්‍රකාශනයේ ආදායමක් ලෙස දක්වා ඇත. මූලධන වියදම් සඳහා ලද රජයේ ආධාර මුදල වැය නොවූ මූලධන ආධාර යටතේ ගිණුම් ගත කර ඇති අතර වැය කළ මුදල ප්‍රාග්ධන ගිණුමට මාරු කර ඇත. අදාළ තොරතුරු පහත පරිදි වේ.

| | 2012 වර්ෂයේ දී ලැබුණු මුදල (රු.) | වැය නොකළ මුදල (රු.) |
|---|---|---|
| පුනරාවර්තන ආධාර | 9,400,000.00 | - |
| | | |
| ප්‍රාග්ධන ප්‍රධාන | | |
| | | |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 2,401,000.00 | 1,350,473.60 |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 2,000,000.00 | 1,874,618.63 |
| **එකතුව** | 13,801,000.00 | 3,225,092.23 |

මූලධන වියදම් ප්‍රතිපාදන ක්‍රමක්ෂය

මූලධන වියදම් සඳහා ලද ප්‍රතිපාදන ප්‍රාග්ධනිත කර අදාළ වත්කම්හි ඵලදායී ජීවිත කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ. මිලදීගත් වර්ෂයේ දී ක්‍රමක්ෂය නොකිරීම හා ඉවත්කරන වර්ෂයේ දී සම්පූර්ණ වර්ෂය සඳහා ක්‍රමක්ෂය කිරීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ.

**04 .** දේපල පිරියත හා උපකරණ

(අ) 05.10.1995 දින දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක 649 අනුව සරල මාර්ග ක්‍රමය යටතේ දේපල පිරියත හා කාර්යාල උපකරණ ක්ෂය කර ඇත. වත්කම මිලදීගත් වර්ෂයේ ක්ෂය නොකරන අතර වත්කම් ඉවත් කරන වර්ෂයේ මුළු වර්ෂයටම ක්ෂය ගණනය කිරීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ.

(ආ) පිළිගත් වාර්ෂික ක්ෂය ප්‍රතිපාදන ප්‍රතිශතයන් පහත පරිදි වේ.

- ගෘහභාණ්ඩ හා සවිකිරීම් 10%
- කාර්යාල උපකරණ 20%

5

- ❖ පරිගණක හා උපාංග 20%
- ❖ පුස්තකාල පොත් 20%
- ❖ පාපැදි 20%
- ❖ ගොඩනැගිලි 2.5%

(ඈ) ස්ථාවර වත්කම්වල අපේක්ෂිත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කර ඇත.

(ඇ) ස්ථාවර වත්කම් සමුච්චිත ක්ෂය අඩු කළ පසු වටිනාකමට දක්වා ඇත.

(ඉ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍යන්ගේ ප්‍රයෝජනය සඳහා ආයතනය විසින් මිල දී ගත් පුස්තකාල පොත් හා වාර සඟරා විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පුස්තකාල වෙත යවා ඇත.

5. **කෙටිකාලීන ආයෝජන**

කෙටිකාලීන මුදල් අතිරික්තයන් මහජන බැංකුවේ "කෙටිකාලීන ස්ථාවර තැන්පතු" මත ආයෝජනය කර ඇත. ලද පොලිය ද සහිතව ආයෝජනයන්හි ශේෂය ගණනය කරඇත.

6. **තොග ගණනය**

පෙර ඇතුළු පෙර පිටවීම් ක්‍රමයට (FIFO) අනුව පිරිවැය මත අවසන් තොගය ගණනය කර ඇත

7. **වගකීම්**

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන අවස්ථාවේ දී හඳුනාගත් සියලු වගකීම් ගිණුම් ගත කර ඇත.

8. **වෙන්කිරීම**

වර්ෂ 01 ක අඛණ්ඩ සේවාකාලයක් සහිත කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙනුවෙන් විශ්‍රාම පාරිතෝශික සඳහා වෙන් කිරීම් කර ඇත. නමුත් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වර්ෂ 05 ක අඛණ්ඩ සේවාකාලයක් සහිත කාර්ය මණ්ඩල සාමාජිකයන්හට පමණක් විශ්‍රාම ගැනීමේ දී විශ්‍රාම පාරිතෝශිකය ලැබීමට හිමිකම් ඇත්තේය.

9. **ආදායම හඳුනා ගැනීම**

රජයෙන් ලැබුණු ප්‍රදානයන් සහ අභ්‍යන්තර ඉපයීම් උපචිත පදනම මත ආදායම් ලෙස ගිණුම්ගත කර ඇත.

10. **වියදම් හඳුනා ගැනීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති වියදම් ශීර්ෂයන්ට අනුකූලව වියදම් වර්ගීකරණය හා විශ්ලේෂණය සිදුකර ඇත.

11. **බදු කරණය**

දේශීය ආදායම් පනතේ විධානයන්ට අනුව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ලැබෙන ලාභාංශ හා පොලී ආදායම් හැර අනෙකුත් ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

12. **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වක්‍ර ක්‍රමය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
## මූල්‍ය තත්ව ප්‍රකාශනය සඳහා සටහන්

සටහන - 01

**බැංකුවේ ඇති මුදල්**

| | 2013 Rs. | 2012 Rs. |
|---|---|---|
| මහජන බැංකු ගිණුම් අංක 174100 156 838310 | 264,414.76 | 386,956.81 |
| මහජන බැංකු ගිණුම් අංක 174100 246 838311 | 103,073.00 | 275,053.00 |
| මහජන බැංකු ගිණුම් අංක 174100 336 838312 | 3,222,987.58 | 76,520.28 |
| | 3,590,475.34 | 738,530.09 |

සටහන - 02

**සේවක ණය හා අත්තිකාරම්**

| | 2013 Rs. | 2012 Rs. |
|---|---|---|
| ආපදා ණය | 495,865.00 | 368,505.00 |
| සේවක ණය | - | 1,360.00 |
| වාහන ණය | 3,100.00 | 4,100.00 |
| උත්සව අත්තිකාරම් | 6,000.00 | 4,500.00 |
| විශේෂ අත්තිකාරම් | - | 2,500.00 |
| | 504,965.00 | 380,965.00 |

සටහන - 03

**ශිෂ්‍යයන්ගෙන් ලැබියයුතු ගාස්තු**

| | 2013 Rs. | 2012 Rs. |
|---|---|---|
| ලැබියයුතු අධ්‍යයන ගාස්තු | 823,450.00 | 261,559.00 |
| ලැබියයුතු කෙටිකාලීන පාඨමාලා අධ්‍යයන ගාස්තු | 6,500.00 | - |
| ලැබියයුතු නිබන්ධන ගාස්තු | 72,612.00 | 28,418.00 |
| ලැබියයුතු විභාග ගාස්තු | 10,400.00 | - |
| | 912,962.00 | 289,977.00 |

සටහන - 04

**කෙටි කාලීන ආයෝජන**

| | 2013 Rs. | 2012 Rs. |
|---|---|---|
| ආරම්භක ශේෂය | 8,027,257.55 | 5,826,360.32 |
| කෙටි කාලීන ආයෝජන මත පොලී නැවත ආයෝජනය කිරීම | 1,014,598.50 | 638,177.69 |
| වර්ෂය තුළ නව කෙටි කාලීන ආයෝජන | 2,000,000.00 | 2,500,000.00 |
| වර්ෂය තුළ කෙටි කාලීන ආයෝජන ආපසු ගැනීම් | - | (937,280.46) |
| | **11,041,856.05** | **8,027,257.55** |

සටහන - 05

**කලින් ගෙවීම් සහ ලැබියයුතු දෑ**

| | 2013 Rs. | 2012 Rs. |
|---|---|---|
| ලැබියයුතු පොලී | 136,573.47 | 110,080.52 |
| කලින් ගෙවීම් | 20,069.98 | 9,000.00 |
| | 156,643.45 | 119,080.52 |

සටහන - 06

ජංගම නොවන වත්කම්

(රු)

| | ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | කාර්යාල උපකරණ | පුස්තකාල පොත් හා වාර සඟරා | පරිගණක හා උපාංග | ඉඩම් හා ගොඩනැඟිලි | පාපැදිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| පිරිවැය | | | | | | | |
| 01/01/2013 දිනට ශේෂය | 528,380.61 | 1,763,817.00 | 1,698,837.74 | 1,616,619.72 | - | - | 5,607,655.07 |
| (+) වර්ෂය තුල මිලදී ගැනීම් | 131,629.40 | 45,800.00 | 126,543.30 | 748,989.51 | 204,250.00 | 10,700.00 | 1,267,912.21 |
| ( -) වර්ෂය තුල බැහැරකිරීම් | - | (4,500.00) | - | - | - | - | (4,500.00) |
| 31/12/2013 දිනට ශේෂය | **660,010.01** | **1,805,117.00** | **1,825,381.04** | **2,365,609.23** | **204,250.00** | **10,700.00** | **6,871,067.28** |
| ක්ෂය සඳහා වෙන් කිරීම් | | | | | | | |
| 01/01/2013 දිනට ශේෂය | 174,448.06 | 789,574.60 | 747,187.31 | 750,032.16 | - | - | 2,461,242.13 |
| (+) වසර සඳහා ක්ෂය වෙන් කිරීම් | 52,838.06 | 351,908.20 | 236,908.29 | 323,323.94 | - | - | 964,978.49 |
| ( -) වර්ෂය තුල බැහැරකිරීම් | - | (3,600.00) | - | - | - | - | (3,600.00) |
| 31/12/2013 දිනට ශේෂය | **227,286.12** | **1,137,882.80** | **984,095.60** | **1,073,356.10** | - | - | **3,422,620.62** |
| 01/01/2013 දිනට ශුද්ධ පොත් අගය | 353,932.55 | 974,242.40 | 951,650.43 | 866,587.56 | - | - | 3,146,412.94 |
| 31/12/2013 දිනට ශුද්ධ පොත් අගය | **432,723.89** | **667,234.20** | **841,285.44** | **1,292,253.13** | **204,250.00** | **10,700.00** | **3,448,446.66** |

සටහන - 07

## උපචිත වියදම්

| | 2013 | 2012 |
|---|---|---|
| | (රු) | (රු) |
| 2013 වර්ෂය සඳහා විගණන ගාස්තු | 140,000.00 | - |
| 2010 වර්ෂය සඳහා විගණන ගාස්තු | - | 129,360.00 |
| 2011 වර්ෂය සඳහා විගණන ගාස්තු | 142,296.00 | 142,296.00 |
| 2012 වර්ෂය සඳහා විගණන ගාස්තු | 156,525.60 | 156,525.60 |
| විදුලි සංදේශ වියදම් | 13,215.49 | 16,748.79 |
| අතිකාල දීමනා | 7,137.00 | 12,972.00 |
| විභාග ගාස්තු | 600.00 | 600.00 |
| බාහිර කථීකාචාර්ය හා විභාග ගාස්තු | 132,800.00 | 111,695.00 |
| සාමාජිකත්ව ගාස්තු | - | 9,575.00 |
| සංග්‍රහ වියදම් | 5,650.00 | 5,650.00 |
| ගමන් වියදම් | 22,680.00 | 2,640.00 |
| මුද්දර ගාස්තු හා උපයනවිට ගෙවීම් | 875.00 | 1,675.00 |
| කෙටිකාලීන පාඨමාලා වියදම් | - | 6,000.00 |
| සංයුක්ත සැලැස්ම සැකසීම සඳහා වියදම් | - | 18,000.00 |
| කෙටිකාලීන පාඨමාලා වියදම් | - | 23,664.00 |
| පාඨමාලා නිබන්ධන ලිවීම සහ සංස්කරණය සඳහා වියදම් | - | 24,000.00 |
| ගෙවියයුතු වේතන | 42,291.51 | - |
| | 664,070.60 | 661,401.39 |

සටහන - 08

## විවිධ ණයහිමියෝ

| | 2013 | 2012 |
|---|---|---|
| | (රු) | (රු) |
| සොෆ්ට්ලොජික් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස් | 15,792.00 | 15,792.00 |
| | 15,792.00 | 15,792.00 |

සටහන - 09

## ශිෂ්‍ය ගාස්තු කලින් ලැබීම්

| | 2013 | 2012 |
|---|---|---|
| | (රු) | (රු) |
| අධ්‍යයන ගාස්තු කලින් ලැබීම් | 1,246,600.00 | 1,310,501.00 |
| නිබන්ධන ගාස්තු කලින් ලැබීම් | 20,168.00 | 80,166.00 |
| විභාග ගාස්තු කලින් ලැබීම් | 61,600.00 | 50,600.00 |
| ලියාපදිංචි ගාස්තු කලින් ලැබීම් | 57,750.00 | 43,592.00 |
| පරිපූරක ගාස්තු කලින් ලැබීම් | 41,250.00 | 34,667.00 |
| කෙටිකාලීන පාඨමාලා අධ්‍යයන ගාස්තු කලින් ලැබීම් | 20,000.00 | 46,000.00 |
| පුස්තකාල ගාස්තු කලින් ලැබීම් | 10,400.00 | - |
| | 1,457,768.00 | 1,565,526.00 |

සටහන - 10

| පාරිතෝෂික සඳහා වෙන් කිරීම | 2013 (රු) | 2012 (රු) |
|---|---|---|
| ආරම්භක ශේෂය | 428,810.00 | 256,600.50 |
| වර්ෂය තුළ පාරිතෝෂික ගෙවීම් | - | - |
| වර්ෂය සඳහා වෙන් කිරීම් | 84,405.00 | 172,209.50 |
| | 513,215.00 | 428,810.00 |

සටහන - 11

| වැය කළ මූලධන ප්‍රතිපාදන | 2013 (රු) | 2012 (රු) |
|---|---|---|
| ආරම්භක ශේෂය | 2,566,252.94 | 2,526,860.26 |
| වත්කම් අත්කරගැනීම් | 1,253,412.70 | 744,237.09 |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය | (848,946.50) | (704,844.41) |
| | 2,970,719.14 | 2,566,252.94 |

සටහන - 12

| වැය නොකළ මූලධන ප්‍රතිපාදන | 2013 (රු) | 2012 (රු) |
|---|---|---|
| ආරම්භක ශේෂය | 77,504.93 | 321,742.02 |
| රජයෙන් ලැබුණු ප්‍රතිපාදන | 4,401,000.00 | 500,000.00 |
| වත්කම් අත්කරගැනීම් | (1,253,412.70) | (744,237.09) |
| | 3,225,092.23 | 77,504.93 |

සටහන - 13

| පොලී ආදායම | 2013 (රු) | 2012 (රු) |
|---|---|---|
| කෙටිකාලීන ආයෝජනවලින් ලද පොලී | 1,041,091.45 | 697,077.59 |
| සේවක ණය හා අත්තිකාරම්වලින් ලද පොලී | 22,070.11 | 11,252.07 |
| | 1,063,161.56 | 708,329.66 |

සටහන - 14

| පුද්ගල පඩිනඩි | 2013 (රු) | 2012 (රු) |
|---|---|---|
| අධ්‍යයන | | |
| වැටුප් හා වේතන | | |
| වැටුප් හා වේතන | 1,685,332.90 | 997,102.50 |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 331,745.88 | 126,226.18 |
| විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල | 151,971.19 | 42,644.20 |
| සේවක භාරකාර අරමුදල 3% | 96,743.43 | 33,774.07 |
| බාහිර කථිකාචාර්ය වරුන්ට ගෙවීම් | 155,250.00 | 111,000.00 |
| අභ්‍යන්තර කථිකාචාර්ය වරුන්ට ගෙවීම් | 50,000.00 | |
| | 2,471,043.40 | 1,310,746.95 |
| වෙනත් දීමනා | | |
| අධ්‍යයන දීමනා | 1,283,112.05 | 648,830.60 |
| පර්යේෂණ දීමනාව | 589,866.52 | 249,275.63 |
| ජීවන වියදම් දීමනා | 256,335.48 | 128,700.00 |
| විශේෂ දීමනාව | 290,204.19 | 128,089.37 |
| වැඩ බැලීමේ ගෙවීම් | | 24,000.00 |
| | 2,419,518.24 | 1,178,895.60 |
| **පුද්ගල පඩිනඩි - අධ්‍යයන** | **4,890,561.64** | **2,489,642.55** |

| අනධ්‍යයන | 2013 (රු) | 2012 (රු) |
|---|---|---|
| **වැටුප් හා වේතන** | | |
| වැටුප් හා වේතන | 1,668,285.01 | 1,291,924.65 |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 177,561.16 | 151,051.55 |
| විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල | 146,931.60 | 91,119.00 |
| සේවක භාරකාර අරමුදල 3% | 64,898.56 | 48,434.12 |
| වැඩ බැලීමේ ගෙවීම් | - | 24,562.50 |
| | 2,057,676.33 | 1,607,091.82 |
| **වෙනත් දීමනා** | | |
| භාෂා දීමනාව | | 2,940.00 |
| ජීවන වියදම් දීමනා | 495,000.00 | 330,525.00 |
| විශේෂ දීමනාව | 286,572.26 | 171,043.43 |
| | 781,572.26 | 504,508.43 |
| පුද්ගල පඩිනඩි - අනධ්‍යයන | **2,839,248.59** | **2,111,600.25** |
| අතිකාල දීමනා හා නිවාඩු දින ගෙවීම් | | |
| අතිකාල දීමනා | 124,741.00 | 67,390.69 |
| නිවාඩු දින ගෙවීම් | - | - |
| | 124,741.00 | 67,390.69 |
| පුද්ගල පඩිනඩි මුළු එකතුව | **7,854,551.23** | **4,668,633.49** |

සටහන - 15

| ගමන් වියදම් | 2013 (රු) | 2012 (රු) |
|---|---|---|
| දේශීය | 43,987.00 | 35,257.60 |
| විදේශීය | - | - |
| | 43,987.00 | 35,257.60 |

සටහන - 16

| සැපයුම් හා පාරිභෝගික වියදම් | 2013 (රු) | 2012 (රු) |
|---|---|---|
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 354,783.37 | 259,780.94 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 270,480.00 | 208,600.00 |
| වෙනත් | | |
| නිල ඇඳුම් | 3,090.97 | 5,760.14 |
| වෙනත් | 9,693.00 | - |
| | 638,047.34 | 474,141.08 |

සටහන - 17

| නඩත්තු වියදම් | 2013 | 2012 |
|---|---|---|
| | (රු) | (රු) |
| දේපල පිරියත හා උපකරණ | 43,050.00 | 25,984.00 |
| ගොඩනැගිලි හා සැලසුම් | 4,500.00 | - |
| | 47,550.00 | 25,984.00 |

සටහන - 18

| ගිවිසුම්ගත සේවා | 2013 | 2012 |
|---|---|---|
| | (රු) | (රු) |
| තැපැල් ගාස්තු | 55,460.00 | 35,409.00 |
| විදුලි සංදේශ වියදම් | 125,766.44 | 131,192.20 |
| විදුලිය | 152,943.60 | 152,943.60 |
| ජලය | 27,056.40 | 27,056.40 |
| මුද්‍රණ හා ප්‍රචාරණ | 94,084.60 | 427,984.68 |
| | 455,311.04 | 774,585.88 |

සටහන - 19

| වෙනත් පුනරාවර්තන වියදම් | 2013 | 2012 |
|---|---|---|
| | (රු) | (රු) |
| විශේෂ සේවා - කළමණාකරන කමිටු වියදම් | 437,700.00 | 399,089.00 |
| විශේෂ සේවා - වෘත්තීය හා අනෙකුත් ගෙවීම් | 140,000.00 | 156,525.60 |
| වැඩමුළු සහ සම්මන්ත්‍රණ | 152,512.00 | - |
| අධ්‍යයන පර්යේෂණ හා පළකිරීම් | - | 800.00 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය (පරිපාලකයන් සඳහා පුහුණු කිරීම) | - | 9,000.00 |
| සිසුන් සඳහා පාඨමාලා නිබන්ධන | - | 24,000.00 |
| සංයුක්ත සැලැස්ම සඳහා වියදම් | - | 18,000.00 |
| දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ගාස්තු | - | 7,080.00 |
| සංග්‍රහ වියදම් | 151,423.00 | 95,915.79 |
| බැංකු ගාස්තු | 13,912.90 | 7,601.40 |
| සාමාජිකත්ව හා දායකත්ව ගාස්තු | 9,988.07 | 9,575.00 |
| විභාග වියදම් | 162,839.75 | 103,635.00 |
| වත්කම් විකිණීමේ අලාභ | 900.00 | - |
| කෙටිකාලීන පාඨමාලා වියදම් | 278,061.40 | 94,769.80 |
| වෙනත් | 256,680.40 | 83,402.00 |
| | 1,604,017.52 | 1,009,393.59 |

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

*31.12.2013 දිනට ශේෂ පත්‍රය*

| කේතය | ගිණුම | හර | බැර |
|---|---|---|---|
| 0 | මුදල් පොතේ අවසාන ශේෂය | 3,590,475.34 | - |
| 1101 | රජයේ ආධාර - පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන | - | 9,400,000.00 |
| 01-A | ප්‍රාග්ධනය ගිණුම | - | 3,819,665.64 |
| 01-B1 | වැය නොකළ මූලධන ප්‍රතිපාදන - පුනරුත්තාපන - ගොඩනැගිලි හා සවිකිරීම් | - | 395,750.00 |
| 01-B3 | වැය නොකළ මූලධන ප්‍රතිපාදන - පුනරුත්තාපන - වෙනත් වත්කම් | - | 801,000.00 |
| 01-C1 | වැය නොකළ මූලධන ප්‍රතිපාදන - ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | - | 153,723.27 |
| 01-C2 | වැය නොකළ මූලධන ප්‍රතිපාදන - පුස්තකාල පොත් හා වාර සඟරා | - | 1,874,618.96 |
| 302 | ලියාපදිංචි ගාස්තු (පශ්චාද් උපාධි) | - | 62,842.00 |
| 0302B | ලියාපදිංචි ගාස්තු කලින් ලැබීම් (පශ්චාද් උපාධි) | - | 57,750.00 |
| 304 | අධ්‍යයන ගාස්තු (පශ්චාද් උපාධි) | - | 2,558,792.00 |
| 0304A | ලැබිය යුතු අධ්‍යයන ගාස්තු (පශ්චාද් උපාධි) | 829,950.00 | - |
| 0304B | ලැබිය යුතු අධ්‍යයන ගාස්තු කලින් ලැබීම්(පශ්චාද් උපාධි) | - | 1,257,000.00 |
| 305 | විභාග ගාස්තු (පශ්චාද් උපාධි) | - | 134,400.00 |
| 0305B | විභාග ගාස්තු කලින් ලැබීම් (පශ්චාද් උපාධි) | - | 61,600.00 |
| 0305A | ලැබිය යුතු විභාග ගාස්තු (පශ්චාද් උපාධි) | 10,400.00 | |
| 308 | ණය සහ අත්තිකාරම්වලින් ලද පොලී ආදායම් | - | 22,070.11 |
| 309 | පොලී ආදායම් | - | 1,041,091.45 |
| 312 | අයදුම්පත් විකුණුම් ආදායම් | - | 102,000.00 |
| 318 | විවිධ ලැබීම් | - | 56,243.00 |
| 319 | පරිපූරක ගාස්තු | - | 48,417.00 |
| 0319B | පරිපූරක ගාස්තු කලින් ලැබීම් | - | 41,250.00 |
| 320 | නිබන්ධන ගාස්තු | - | 220,442.00 |
| 0320A | ලැබිය යුතු නිබන්ධන ගාස්තු | 72,612.00 | - |
| 0320B | නිබන්ධන ගාස්තු කලින් ලැබීම් | - | 20,168.00 |
| 324 | නිබන්ධන ගාස්තු කෙටිකාලීන පාඨමාලා | - | 596,000.00 |
| 0324A | නිබන්ධන ගාස්තු කෙටිකාලීන පාඨමාලා කලින් ලැබීම් | - | 20,000.00 |
| 325 | අයදුම්පත් විකුණුම් ආදායම් කෙටිකාලීන පාඨමාලා | - | 15,100.00 |
| 05-0001 | ප.උ.ඉ.භා. ආයතන සංවර්ධන අරමුදල | - | 3,959,285.43 |
| 05-0003 | කෙටිකාලීන පාඨමාලා ගිණුම | 278,061.40 | - |
| 06-07-1.1.1 | වැටුප් හා වේතන අධ්‍යයන | 1,685,332.90 | - |
| 06-07-1.1.2 | වැටුප් හා වේතන අනධ්‍යයන | 1,668,285.01 | - |
| 06-07-1.11 | බාහිර කථිකාචාර්ය ගෙවීම් | 155,250.00 | - |
| 06-07-1.12 | අතිකාල දීමනා | 124,741.00 | - |
| 06-07-1.15.1 | විශේෂ දීමනා අධ්‍යයන | 290,204.19 | - |
| 06-07-1.15.2 | විශේෂ දීමනා අනධ්‍යයන | 286,572.26 | - |
| 06-07-1.16 | පර්යේෂණ දීමනා | 589,866.52 | - |
| 06-07-1.17 | ප.උ.ඉ.භා. ආයතන කථිකාචාර්ය ගෙවීම් | 50,000.00 | - |
| 06-07-1.2.1 | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල අධ්‍යයන | 331,745.88 | - |
| 06-07-1.2.2 | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල අනධ්‍යයන | 177,561.16 | - |
| 06-07-1.3.1 | විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල අධ්‍යයන | 151,971.19 | - |
| 06-07-1.3.2 | විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල අනධ්‍යයන | 146,931.60 | - |
| 06-07-1.4.1 | සේවක භාරකාර අරමුදල 3% අධ්‍යයන | 96,743.43 | - |
| 06-07-1.4.2 | සේවක භාරකාර අරමුදල 3% අනධ්‍යයන | 64,898.56 | - |
| 06-07-1.6 | අධ්‍යයන දීමනා | 1,283,112.05 | - |
| 06-07-1.8.1 | ජීවන වියදම් දීමනා අධ්‍යයන | 256,335.48 | - |
| 06-07-1.8.2 | ජීවන වියදම් දීමනා අනධ්‍යයන | 495,000.00 | - |

15

| | | | |
|---|---|---|---|
| 06-07-2.1 | ගමන් වියදම් - දේශීය | 43,987.00 | - |
| 06-07-3.1 | ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 354,783.37 | - |
| 06-07-3.2 | ඉන්ධන සහ ලිහිසි තෙල් | 270,480.00 | - |
| 06-07-3.3 | නිල ඇඳුම් | 3,090.97 | - |
| 06-07-3.4 | යාන්ත්‍රික සහ විදුලි උපකරණ | 5,310.00 | - |
| 06-07-3.7 | අනෙකුත් සැපයුම් | 4,383.00 | - |
| 06-07-4.2 | නඩත්තු - යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 43,050.00 | - |
| 06-07-4.5 | අනෙකුත් නඩත්තු වියදම් | 4,500.00 | - |
| 06-07-5.10 | මුද්‍රණ හා ප්‍රචාරණ වියදම් | 94,084.60 | - |
| 06-07-5.2 | විදුලි සංදේශ වියදම් | 125,766.44 | - |
| 06-07-5.3 | තැපැල් වියදම් | 55,460.00 | - |
| 06-07-5.4 | විදුලිය වියදම් | 152,943.60 | - |
| 06-07-5.6 | ජල වියදම් | 27,056.40 | - |
| 06-07-6.16 | සංග්‍රහ වියදම් | 151,423.00 | - |
| 06-07-6.17 | බැංකු ගාස්තු | 13,912.90 | - |
| 06-07-6.19 | දායක මුදල් සහ සාමාජික ගාස්තු | 9,988.07 | - |
| 06-07-6.2 | විශේෂ සේවා - පාලක සභා හා කමිටු | 437,700.00 | - |
| 06-07-6.21 | විභාග වියදම් | 162,839.75 | - |
| 06-07-6.22 | අනෙකුත් පුනරාවර්තන වියදම් | 256,680.40 | - |
| 06-07-6.3 | විශේෂ සේවා - වෘත්තීය හා අනෙකුත් ගෙවීම් | 140,000.00 | - |
| 06-07-6.4 | වැඩමුළු සහ සම්මන්ත්‍රණ | 152,512.00 | - |
| 06-A | පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා අරමුදල | - | 3,529,967.18 |
| 1-Aug | පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | - | 513,215.00 |
| 10-B | පරිත්‍යාග | - | 14,499.52 |
| 11-C | ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 660,010.01 | - |
| 11-D | පුස්තකාල පොත් හා වාර සඟරා | 1,825,381.04 | - |
| 11-E | කාර්යාල උපකරණ | 1,805,117.00 | - |
| 11-I | වෙනත් වත්කම් | 10,700.00 | - |
| 11-N | පරිගණක හා උපාංග | 2,365,609.24 | - |
| 12-C | ක්ෂය වෙන්කිරීම් - ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | - | 227,286.13 |
| 12-D | ක්ෂය වෙන්කිරීම් - පුස්තකාල පොත් | - | 984,095.60 |
| 12-E | ක්ෂය වෙන්කිරීම් - කාර්යාල උපකරණ | - | 1,137,882.80 |
| 12-N | ක්ෂය වෙන්කිරීම් - පරිගණක හා උපාංග | - | 1,073,356.10 |
| 12-O | වත්කම් විකිණීමේ ගිණුම | 900.00 | - |
| 13-A | කෙටිකාලීන ආයෝජන | 11,041,856.05 | - |
| 14-N | ලැබිය යුතු ආදායම් ගිණුම | 136,573.47 | - |
| 15 | උත්සව අත්තිකාරම් | 6,000.00 | - |
| 15-012 | ආපදා ණය | 495,865.00 | - |
| 15-015 | වාහන ණය | 3,100.00 | - |
| 23 | කලින් ගෙවීම් | 20,069.98 | - |
| 28-A | විවිධ ණය හිමියෝ | - | 15,792.00 |
| 28-B | මුද්දර ගාස්තු | - | 875.00 |
| 28-C | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | - | 58,550.97 |
| 29 | උපචිත වියදම් | - | 663,195.60 |
| 35 | ගබඩා අත්තිකාරම් | 167,108.00 | - |
| 38-02 | ක්ෂය ගිණුම | 964,978.50 | - |
| 38-1 | පාරිතෝෂික | 84,405.00 | - |
| 40-F | ගොඩනැගිලි - කෙරීගෙන යන වැඩ | 204,250.00 | - |
| | | 34,937,924.76 | 34,937,924.76 |

# 9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

## විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඊසී/එච්/පීජීඅයිඊ/1/13 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2 014 ඔක්තෝබර් ?/ දින |

අධ්‍යක්ෂ,

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.

**ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2014 අප්‍රේල් 03 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. · No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්තවාගණනය කරනු ලැබේ.

**02. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2:2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව දේපළ පිරියත හා උපකරණ වෙනුවෙන් ක්ෂය කිරීමේදී, වත්කම් භාවිතය සඳහා යෝග්‍ය තත්ත්වයට පත්කළ දින සිට ක්ෂය කළ යුතු වුවද, ආයතනය විසින් වත්කම් මිලදී ගත් වර්ෂයේ ක්ෂය නොකිරීම හා වත්කම් ඉවත්කරන වර්ෂයේ සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වෙන්කිරීම වර්ෂය තුළ මිලදී ගත් වත්කම් වෙනුවෙන් රු.45,919 ක් අඩුවෙන් ගණනය කර තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන්වේ.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 40(5) වගන්තිය | කළමනාකරණ මණ්ඩල සාමාජිකයකු රැස්වීම් වාර 03 කට අඛණ්ඩව සහභාගි නොවන්නේ නම් වෙනත් සාමාජිකයකු පත්කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අඛණ්ඩව රැස්වීම් වාර 08 කට නොපැමිණි නිළධාරියෙක් වෙනුවට වෙනත් නිලධාරියෙකු පත්කිරීම ප්‍රමාද කර තිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්වවිද්‍යාල සේවයේ නියුක්ත සෑම තැනැත්තකුම පැමිණීම හා පිටවීම සටහන් කළ යුතු වුවද, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, 2013 වර්ෂය වෙනුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා වශයෙන් රු.4,735,312 ක් ගෙවා ඇතත් එම ගෙවීම සනාථ කිරීම සඳහා වූ පැමිණීමේ ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2005 අංක 4 දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන නියමාවලියේ 4(ඇ) හා (ඉ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබූ කෙටිකාලීන පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,413,496 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,081,211 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,332,285 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2012 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අයදුම්පත්‍ර ආදායම රු.26,000 කින් අඩුවී තිබුණි. තවද 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ වර්ෂ 04 කදී පශ්චාත් උපාධි සුදුසුකම ලබාගත් ශිෂ්‍යයන් සංඛ්‍යාව 18 ක් විය.

(ආ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීමේ පශ්චාත් උපාධි පාඨමාලාව (Teaching English Literature in the Second Language Context) සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේ ලැබී තිබුණද, විගණිත දින (2014 අප්‍රේල් 03) වන විටත් පාඨමාලා සකස් කිරීම පිළිබඳ කටයුතු, ඉගෙනුම් ආධාරක සැකසීම සහ නීති රීති සහ නියමයන් සම්පාදනය කිරීම නිමකර නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

මූල්‍ය කටයුතු සාකච්ඡා කිරීම හා අනුමැතිය ලබාගැනීම සඳහා මූල්‍ය කමිටුවක් ස්ථාපිතකර නොතිබුණි. මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවීණතාවයක් ඇති එක් නිලධාරියකුගෙන් පමණක් සමන්විත කළමනාකරණ රැස්වීම් වලදී අදාළ මූල්‍ය ගැටළු සාකච්ඡා කර ඇති බව නිරීක්ෂණය විය.

4.3 අරමුදල් ඌන උපයෝජනය

2013 වර්ෂයේ යන්ත්‍ර, ලීබඩු හා කාර්යාල උපකරණ සහ පොත් හා සඟරා මිලදී ගැනීම සඳහා රු.4,401,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර, එම ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,253,413 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව අධි ප්‍රතිපාදන අනුමත කරවා ගැනීම නිසා 2013 වර්ෂයේ එම වෙන්කල ප්‍රතිපාදන වලින් රු.3,225,092 ක් වැයකර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන වැඩසටහනෙහි ආයතනයේ කටයුතු වලින් සියයට 60 ක් පරීක්ෂා කරන බව සඳහන් වී තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා විගණන විමසුම් 02 ක් පමණක් නිකුත් කර තිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

තථ්‍ය ආදායම, අයවැයගත ආදායමට වඩා සියයට 244 කින් ඉක්මවා තිබූ අතර තථ්‍ය පුනරාවර්තන වියදම, අයවැයගත පුනරාවර්තන වියදමට වඩා සියයට 98 කින් අඩු වී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය හා කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

ආයතනයේ 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2014 අප්‍රේල් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පහත පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) අයවැය පාලනය
(ආ) සේවක කළමනාකරණය
(ඇ) අධ්‍යයන කටයුතු කළමනාකරණය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති.

# 10. විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු

Postgraduate Institute of English
The Open University of Sri Lanka
P.O. Box 21
Nawala
Nugegoda

Telephone: 011-2825805, 2825806, 2881027, 2881032, 2853777
Director: Ext. 528, SAR: Ext. 527 AB: Ext. 532

2015 ජුනි 11

එච්.ඒ.එස් සමරවීර,
විගණකාධිපති,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

**<u>පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

ඔබ විසින් යොමු කරන ලද 2014 ඔක්තෝබර් 31 දිනැති ලිපියට පිළිතුරු වශයෙනි.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මූල්‍ය චක්‍රලේඛ ලිපි අංක 03/2014 අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07, 2014 ජනවාරි 01 දිනෙන් පසුව අදාළ කරගන්නා ලෙස උපදෙස් දී ඇත.

2.3 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

(අ) කළමනාකරණ මණ්ඩලය (Board of Management) නියෝජනය කිරීම සඳහා යාපනය විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් එහි වාග්විද්‍යාව සහ ඉංග්‍රීසි සාහිත්‍ය අංශයේ අංශ ප්‍රධාන ශිවරාණි සත්ගුණරාජා මහත්මිය 2012 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පත්කරනු ලැබ ඇත. රැස්වීම් සඳහා පැමිණීමේ අපහසුතා මත ඇය සහභාගි වී නොමැත. ඒ වෙනුවට වෙනත් අයෙකු පත් කිරීමට කටයුතු යොදන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වනු ලැබ ඇති අතර ඒ පිළිබඳව කළමනාකරණ මණ්ඩලයේ ද සාකච්ඡා කොට ඇත. මේ පිළිබඳව නැවත දැනුම් දීමක් 2014 මැයි මස දී සිදු කොට ඇත.

(ආ) විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ රාජකාරි කටයුතු හා වගකීම් පන්තිකාමරවල සිදු කෙරෙන සාමාන්‍ය ඉගැන්වීම් කටයුතුවලට වඩා බෙහෙවින් පුළුල් ක්‍රියාවලියකි. පර්යේෂණ හා ප්‍රකාශන, විශ්වවිද්‍යාල අධ්‍යයන ග්‍රන්ථ සම්පාදනය, විභාග කටයුතු, පරිපාලන කටයුතු සහ අධ්‍යාපනය සම්බන්ධ ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක වීම ආදිය ඒවායින් කීපයකි.

1. විශ්වවිද්‍යාල ආචාර්ය වරයෙකු විසින් නියමිත ඉගෙනුම් ආධාරක සහ ගවේෂණාත්මක අධ්‍යයන, පර්යේෂණ යෝජනා සැකසීම, උදෘත සැකසීම, ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්බන්ධ ලේඛන කාර්යයන්වලින් සමන්විත පර්යේෂණ අධ්‍යයන මෙහෙයවීම අවශ්‍ය කෙරේ. ජාත්‍යන්තරව ස්ථාපිත අධ්‍යාපනික සඟරාවන්හි (Peer reviewed) පළ කිරීම සඳහා පිළිගැනීමට එක් පර්යේෂණ පත්‍රිකාවක් සම්බන්ධයෙන් වාර ගණනාවක් වැඩකටයුතු කිරීමට සිදුවෙයි. ඒ අනුව තර්ක ගොඩනැඟීම, ඇගයීම හා විශ්ලේෂණය කිරීමත් අනුමත උපුටා දැක්වීම හා පරිශීලනීය ආකෘති සැකසීම සම්බන්ධව කටයුතු කිරීම අවශ්‍ය වේ.

2. අධ්‍යයන ග්‍රන්ථ සැකසීම, පෙළ පොත් සැකසීම, මාර්ගෝපදේශ සැකසීම, මාර්ගගත පාඩම් සැකසීම, බහු මාධ්‍ය භාවිතය ආදිය විස්තෘත පර්යේෂණ හා බැඳී පවතී. කියැවීම සහ තොරතුරු සම්ප්‍රේෂණය ආදිය ද මීට අදාළ වේ.

3. නිබන්ධන උපදේශකත්වය (පර්යේෂණ නිබන්ධයන්හි පරිච්ඡේද කියැවීම) සහ උපාධි නිබන්ධන සඳහා ලකුණු ලබා දීම සඳහා මානසික ඒකාග්‍රතාවෙන් යුක්තව කටයුතු කිරීමේ පහසුව අවශ්‍ය කෙරේ.

4. පශ්චාද් උපාධි අධ්‍යයන මට්ටමේ දී දේශන සඳහා සූදානම් වීම වුව ද උසස් තත්වයකට පත් වන්නේ අදාළ දේශකයා විසින් අදාළ මාතෘකාවට අයත් විවිධ කෘති පරිශීලනය සහ අදාළ පර්යේෂණ පිළිබඳ මෑතකාලීන දැනුමෙන් තමන් සමන්විත වීම අවශ්‍ය වන හෙයිනි.

මෙසේ පශ්චාද් උපාධි සම්බන්ධ පර්යේෂණ හා විභාග කාර්යයන් යන දෙකම සහ ඉගෙනුම් ආධාරක සැකසීම සඳහා චින්තනය, සංකල්පීය හැකියාව ඇගයීම, නිර්මාණාත්මක හා විචාර පූර්වකව මනස වෙහෙසා කරන කටයුතු වන හෙයින් එය ලිපි ලේඛන ලිවීම, වාර්තා හෝ ගිණුම් ආදිය සැකසීම ආදී කටයුතු හා සමකළ නොහේ.

මනස වෙහෙසා කරන අදාළ කටයුතුවලට අමතරව දූරස්ථ අධ්‍යාපන ආයතනවල ආචාර්යවරුන් සම්බන්ධයෙන් උපදේශකත්වය ලබා දීම මෙන්ම ශිෂ්‍යයන් සම්බන්ධයෙන් දූරකථන හා විද්‍යුත් තැපැල මඟින් තනි පුද්ගල ප්‍රතිපෝෂණමය ප්‍රතිචාර දැක්වීම ආදිය අවශ්‍ය කෙරේ. පශ්චාද් උපාධි ශිෂ්‍යයන් රාජකාරි කාර්යන්හි නිරතව සිටින හෙයින් සාමාන්‍යයෙන් ඉහත සඳහන් කාර්යයන් සිදු කළ හැක්කේ රාජකාරී කාලයෙන් පසුව හෝ රාත්‍රී කාලයේ දී හෝ නිවාඩු දිනයන්හි දී ය.

එම නිසා, පැමිණීම හා පිටවීම සටහන් කරමින් විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු පැය 08 ක කාලයකට සීමා කිරීම විශ්වවිද්‍යාලයේ දියුණුවටත් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වෘත්තීය ක්‍රියාකාරීත්වයටත් හානිකර විය හැක. උක්ත සංකීර්ණ අධ්‍යාපනික හා පර්යේෂණ ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සිදුවනවාද යන්න මැනිය යුත්තේ වෙනත් නිර්නායක යොදා ගනිමින්ය.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීම සිදු කෙරෙන්නේ උපකුලපතිවරයා විසින් අත්සන් තබනු ලබන විශ්වවිද්‍යාල උපාධි ප්‍රදානෝත්සවයේ දී සහතික ප්‍රදානය කරනු ලබන සහ අවම වශයෙන් මාස දොළහක් (12) වත් පාඨමාලා කාලයකින් සමන්විත අඛණ්ඩව ක්‍රියාත්මක වන අධ්‍යයන පාඨමාලාවන් සඳහාය. කෙටිකාලීන පාඨමාලා (Short Courses) අවම වශයෙන් එක් දිනකට හෝ උපරිම වශයෙන් අධ්‍යයන පැය තිහකට (30) සීමා වූ, උපාධිධාරී ගුරුවරුන් සඳහා විශේෂිත වූ අධ්‍යාපන කුශලතා වර්ධනය (Professional development) කිරීමේ අරමුණින් යුතුව සැලසුම් කරනු ලබන පාඨමාලා වේ. එබඳු පාඨමාලාවන් නිරන්තරයෙන් ක්‍රියාත්මක නොවන අතර කාලීන අවශ්‍යතාවක් පැනනගින (Market driven) විට පමණක් ඒවා ක්‍රියාත්මක කෙරේ.

පශ්චාද් උපාධි ආයතන මඟින් කාලීන අවශ්‍යතා අනුව විවිධ මාදිලියේ කෙටිකාලීන පාඨමාලා මෙහෙයවනු ලැබේ. ඒ අනුව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ද කෙටිකාලීන පාඨමාලා මෙහෙයවීම සිදු කරයි. එක් දිනකට හෝ පැය ගණනකට සීමාවන මෙවන් කෙටිකාලීන පාඨමාලාවන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය අපේක්ෂාවෙන් වසරක් පමණ දිගු කලක් බලා සිටීම නිශ්ඵල ක්‍රියාවක් බව පෙනේ.

මෙබඳු පාඨමාලාවන්හි අන්තර්ගතය, කාල පරාසය සහ ඇස්තමේන්තු ගත අයවැය ආදී සියල්ල පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩලය (Board of Study) සහ කළමනාකරණ මණ්ඩලය (Board of Management) මඟින් අනුමත කිරීමෙන් අනතුරුව මෙහෙයවනු ලැබේ.

## 03. මූල්‍ය සමාලෝචනය

### 03.1 මූල්‍ය ප්‍රතිඵලය

2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ අනුව වර්ෂයේ අතිරික්තය රු. 3,413,496 වූ අතර 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ අනුව වර්ෂයේ අතිරික්තය රු. 2,081,211 විය. මේ අනුව 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය 2012 වර්ෂයට සාපේක්ෂව රු.1,332,285 වැඩි වී ඇත. මෙය ආයතනය විසින් ලබා ඇති යහපත් මූල්‍ය ප්‍රගතියකි.

## 04. මෙහෙයුම් සමාලෝචනය

### 04.1 කාර්ය සාධනය

(අ) 2012 වර්ෂය සඳහා දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම 2012 මැයි මස 21 දින සිට ජූනි මස 15 දක්වා කාලය තුළ සිදු කරන ලදී. මේ අතරතුර විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය

මණ්ඩලවල වෘත්තීය ක්‍රියාමාර්ගයන් හේතුවෙන් ආයතනික කාර්යයන් අඩාල විය. ඒ හේතුව නිසා නැවත අයදුම්පත් බාර ගන්නා කාලය 2012 ජූලි මස 25 දක්වා දීර්ඝ කරන ලදී. මෙසේ දෙවරක් දක්වා කාලය දීර්ඝ කිරීම හේතුවෙන් අයදුම්පත් 128 ක් ලැබුණු අතර 2013 අධ්‍යයන වර්ෂයේ දී අයදුම්පත් කැඳවීමේ කාලය මෙසේ දීර්ඝ කිරීමක් සිදු නොවුණු අතර අයදුම්පත් 102 ක් ලැබුණි. ඒ අනුව 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ අයදුම්පත් අදායම ගණනය කිරීම තර්කානුකූල නොවන බව පෙනේ.

2012 වර්ෂයේ පශ්චාද් උපාධි සුදුසුකම ශිෂ්‍යයන් 06 දෙනෙකු විසින් ලබාගෙන තිබුණ ද 2013 වර්ෂයේ දී උපාධි සුදුසුකම සපුරා තිබුණේ 05 දෙනෙකු විසින් පමණි. මේ හැරුණු විට 2013 අධ්‍යයන වර්ෂය වන විට පශ්චාද් උපාධි ඩිප්ලෝමා කොටසට අදාළ ඉගෙනුම් විෂයන් (Taught Courses) 07 අවසන් කොට උපාධි නිබන්ධනය (Thesis) ලිවීමේ කටයුතු අරඹා ඇති සිසුන් සංඛ්‍යාව 12 කි. විවිධ හේතුමත එම නිබන්ධන කටයුතු අවසන් කිරීම ප්‍රමාද වී ඇතත් අදාළ උපදේශකවරුන්ගේ මගපෙන්වීම අනුව මේ අතරින් බහුතරයක් උපාධි නිබන්ධන ලිවීමේ කටයුතුවල නිරතව සිටින බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 35 කි. නමුත් එම අධ්‍යයන වර්ෂයට අදාළව පවත්වන ලද බඳවා ගැනීමේ පරීක්ෂණයෙන් ඉහළ ලකුණු ලබාගත් 53 දෙනෙකුහට ලියාපදිංචි වීම සඳහා දැනුම් දීම සිදු කොට ඇත. කෙසේ වුව ද මේ හා සමකාලීනව කොළඹ විශ්වවිද්‍යාලයේ ද නව ඉංග්‍රීසි පශ්චාද් උපාධි පාඨමාලාව සඳහා ද අයදුම්පත් කැඳවා තිබුණි. කෙසේ වෙතත් අදාළ 53 දෙනාගෙන් මේ වන විට 35 දෙනෙකු අදාළ පාඨමාලාව සඳහා ලියාපදිංචිය ලබා ගෙන ඇති බව පෙන්වා දිය හැකිය.

(ආ) **2013 අගෝස්තු මස දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලැබීමෙන් අනතුරුව දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව සම්බන්ධ සංවර්ධන කටයුතු සිදුවූ කාලරාමුව**

දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (M.A in Teaching English Literature in the Second Language Context) විශිෂ්ට ගණයේ පාඨමාලාවක් වන අතර එම වර්ගයේ පාඨමාලාවන් අතර ලංකාවේ මුල්ම පාඨමාලාව ද වන්නේය. එහෙයින් සියලුම ඉගෙනුම් ආධාරක සියල්ලම අලුතින්ම සකස් කිරීමට සිදුවෙයි. පාඨමාලාවේ විෂයන් නවය (09) සඳහා සම්පත් දායකයන් , ලේඛකයන් සහ සංස්කාරකයන් ලෙස බාහිර සම්පත් දායකයන් ද හඳුනා ගැනීමට අවශ්‍ය කෙරිණි. මෙසේ සම්පත් දායකයන් සම්බන්ධ කරගැනීමෙන් අනතුරුව ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා සාකච්ඡා කීපයක් ද පැවැත්වීමට සිදුවේ. ඉන් පසුව දූරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳව (Distance Education) පුහුණුවක් ද ලබාදීමට අවශ්‍යය. එසේ වන්නේ මෙම සම්පත් දායකයන් සඳහා අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳව මූලික දැනුවත්වීමක් අවශ්‍යවන හෙයිනි.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ඉගැන්වීම පිළිබඳ සංකලනාත්මක ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබන හෙයින් (දූරස්ථ අධ්‍යාපනය සහ මුහුණට මුහුණලා සිදු කෙරෙන පන්ති යන ක්‍රමවේදයන් දෙකම) ලිඛිත පාඨමාලා ආධාරක සහ දෘශ්‍ය ඉගෙනුම් ආධාරක සකස්කිරීමට සිදු වෙයි. මෙය අදියර කීපයකින් සමන්විත කාලය ගතවන ක්‍රියාවලියකි.

1. ලේඛක මණ්ඩලය (Course Team) විසින් විෂය නිර්දේශ ගොඩ නැගීම.
2. ලේඛක මණ්ඩලය විසින් විෂය නිර්දේශයට අදාළ පාඩම් ලිවීම.
3. පරිණත දැනුමකින් සමන්විත අධ්‍යාපනඥයන් මගින් ඒවා සංස්කරණය කිරීම. (Editing for content)
4. දූරස්ථ අධ්‍යාපන ක්‍රමවේදයට සරිලන සේ නැවත සංස්කරණය කිරීම. (Editing for Distance Education)
5. පරිගණක යතුරු ලියනය කිරීම සහ මුද්‍රිත ලේඛන සැකසීම යන ක්‍රියාවලිය සිදුවෙයි.

ඉගෙනුම් ආධාරක සැකසීමේ ක්‍රියාවලිය පාඨමාලා ලේඛක මණ්ඩල (Course writing Team) සාමාජිකයන් අතර රැස්වීම් ගණනාවක් පැවැත්වීමෙන් අනතුරුව සිදුවන්නකි. එසේම අදාළ ඉගෙනුම් ආධාරක පිළිගතහැකි ගුණාත්මක තත්වයෙන් පවතින්නේ ද යන්න පිළිබඳව සනාථ කිරීම සඳහා නැවත සංස්කරණය කිරීමේ දීර්ඝ ක්‍රියාවලියකට ලක්කෙරේ.

සෑම අදියරක දී ම (BOS,BOM, Senate, Senate appointed sub committee) සමස්ත පාඨමාලාව සම්බන්ධව යම් යම් වෙනස්කම් සිදුකරන ලද අතර ඒ හේතුවෙන් අවසන් අනුමැතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබෙනතුරු පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට පාඨමාලා සැකසීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට නොහැකි විය. පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් විගස පාඨමාලා සැකසීමේ කටයුතු පහත සඳහන් අන්දමින් සිදුවිය

1. <u>2013 ජූලි මස</u> - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලැබෙනු ඇතැයි යන උපකල්පනයෙහි පිහිටා මෙම ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා විස්තරාත්මක අයවැය ලේඛනයක් සැකසීම සිදු විය. මෙම අයවැය වාර්තාවෙහි පාඨමාලාවේ ආදායම් සහ වියදම් පිළිබඳවත් පාඨමාලා සැකසීම සඳහා වන වියදම් පිළිබඳවත් අන්තර්ගත විය.

2. <u>2013 අගෝස්තු මස</u> - 2013 අගෝස්තු මස දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලැබුණි.

3. <u>2013 සැප්තැම්බර් මස -</u> ප්‍රාමාණික පාඨමාලා සංස්කාරකයන්, නාට්‍යවේදීන්, නවකතාකරුවන්, ලේඛකයන්, චිත්‍රපට අධ්‍යක්ෂවරුන් සහ මේ පිළිබඳ දැනුම ඇති අනෙකුත් වෘත්තිකයන් මෙන්ම ජාතික විශ්වවිද්‍යාලවල ඉංග්‍රීසි අධ්‍යයනාංශවල ආචාර්යවරු සහ මෙම පාඨමාලාවට දායකවීමේ හැකියාව ඇති විශ්වවිද්‍යාල

5

පද්ධතියෙන් පරිබාහිර අනෙකුත් වෘත්තියවේදීන් මේ සඳහා සම්බන්ධ කරගැනීමට සිදුවිය. එසේම ඔවුන්ගේ දායකත්වය ලබාගතහැකි අවස්ථාවන් සහ මෙම පාඨමාලාවට දායකත්වය ලබාදීමේ කැමැත්ත ආදිය පිළිබඳව නිශ්චය කරගැනීමට සිදු විය.

4. <u>2013 ඔක්තෝම්බර් මස -</u> ඉහත සඳහන් ක්‍රියාවලිය මෙම මස තුළ දී සිදුවිය. එසේ වූයේ අතැම් සම්පත් දායකයින් මේ පිළිබඳ ප්‍රතිචාර දැක්වීම ප්‍රමාද වීම හේතුවෙන් සහ ඍජු දූරකථන මාර්ගයෙන් සහ අනෙකුත් සන්නිවේදන මාධ්‍යයන් මගින් මෙම සම්පත් දායකයින් සම්බන්ධ කරගැනීමට සිදු වූ හෙයිනි.

5. <u>2013 නොවැම්බර් මස</u> - හඳුනා ගනු ලැබූ සියලු පාඨමාලා ලේඛකයන් සහ සංස්කාරකයන් දූරස්ථ අධ්‍යාපනය සඳහා පාඨමාලා සැකසීම පිළිබඳව (Writing for Distance Education) වැඩමුළුවක් 2013 දෙසැම්බර් මස දී පැවැත්වීමට සැලසුම් කරන ලදී. මෙම වැඩමුළුව සඳහා සම්පත් දායකයන් ලෙස සම්බන්ධ විය හැකි අය හඳුනාගැනීමත් ඔවුන් සමඟ මූලික සාකච්ඡා වට දෙකක් පැවැත්වීමත් සිදු විය. ඒ මඟින් අදාළ වැඩමුළුවේ ආකෘතිය සහ අන්තර්ගතය සැකසිය හැකිවිය. අධ්‍යයනය කළයුතු දෑ සහ වැඩමුළුවට සහභාගිවන්නන් සඳහා ලබාදිය යුතු ඉගෙනුම් ආධාරක ආදිය සැකසීමටත් පිටපත් කිරීමටත් සිදු විය.

6. <u>2013 දෙසැම්බර් මස</u> - දෙසැම්බර් මස දී අදාළ වැඩමුළුව විසිදෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව පැවැත්විණි. මෙම වැඩමුළුවේ දී මෙම පාඨමාලාවේ විෂය ඒකක දහසයකින් දහයක් සඳහා පාඨමාලා සැකසුම් කණ්ඩායම් (Course Writing Team) හඳුනා ගන්නා ලද අතර පාඨමාලා අන්තර්ගතය සහ අධ්‍යාපනික එළැඹුම ආදිය පිළිබඳ සාකච්චා කෙරිණි. මේ සම්බන්ධයෙන් දීර්ඝ සාකච්චා සහ වාදවිවාද ඇතිවිය.

7. <u>2013 දෙසැම්බර් මස</u> -විෂය ඒකක දෙකක් සඳහා ද පාඨමාලා සැකසීමේ මූලික කණ්ඩායම් රැස්වීම් (LTO1101 and LTP1102) පැවැත්විණි.

8. 2014 ජනවාරි මස - අනෙකුත් විෂය ඒකක තුනක් සඳහා ද පාඨමාලා සැකසීමේ මූලික කණ්ඩායම රැස්වීම් (LTP1105, LTP1202 LTP1203) පැවැත්විණි.

9. 2014 ජනවාරි මස LTP1101, LTP1102, LTP1105, LTP1202, LTP1203 විෂය ඒකක තුනක් සඳහා දෙවන කණ්ඩායම රැස්වීම් පැවැත්විණි. මීට අමතරව LTP1204 , විෂය ඒකක සඳහා වන ප්‍රථම පාඨමාලා රැස්වීම් පැවැත්විණි. LTP1101, LTP1102, LTP1105, LTP1202, LTP1204 යන විෂය ඒකකවලට අදාළ ඉගෙනුම් ආධාරක ලිවීම ආරම්භ කෙරිණි.

10. 2014 මාර්තු මස සිට 2014 මැයි මස දක්වා කාලය - LTP1101 යන විෂය ඒකකයේ ඉගෙනුම් ආධාරක ලිවීම 100% අවසන් වූ අතර එහි සංස්කරණ ක්‍රියාවලිය ද ආරම්භ විය. LTP1102, විෂය ඒකකයේ ඉගෙනුම් ආධාරක 75% කින් අවසන් විය. LTP1105,

විෂය ඒකකයේ ඉගෙනුම් ආධාරක සැකසීම 30% කින් අවසන් විය. එසේම LTP1202 විෂයේ 20% කින් ද LTP1204 විෂය ඒකකයේ 10% කින් ද වශයෙන් අවසන් වී ඇත.

04.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ඉංග්‍රීසි භාෂා පශ්චාද් උපාධි ආයතනයේ මූල්‍ය කටයුතු ද සාකච්ඡා කෙරෙන්නේ කළමනාකරණ කමිටු (Board of Management) රැස්වීමේ දී ය. ඉංග්‍රීසි භාෂා පශ්චාද් උපාධි ආයතනයේ නියමාවලිය (Ordinance) අනුව මූල්‍ය අංශය නිජෝජනය කිරීම සඳහා විශේෂ ප්‍රතිපාදනයක් නොමැති අතර මෙම මණ්ඩලය සඳහා කමිටු සාමාජිකයන් පත්කිරීමේ සංයුතිය අනුව මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයෙන් නියෝජිතයකු පත් කිරීමට ඉඩ ප්‍රස්ථාවක් නොමැත. එහෙත් මහාභාණ්ඩාගාරය නියෝජනය කරමින් එහි නියෝජිතවරියක් ද මෙම කළමනාකරණ මණ්ඩලය නියෝජනය කරයි. ඊට අමතරව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා එම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා ද කළමනාකරණ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වෙයි.

මෙම ආයතනය සඳහා මූල්‍ය කමිටුවක් පත්කිරීමට ඉදිරියේ දී කටයුතු යොදා ඇත.

04.3 අරමුදල් ඌන උපයෝජනය

2013 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.4,401,000.00 වූ අතර මෙම ප්‍රතිපාදනවලින් රු 2,401,000.00 ආයතනය වෙත ලැබී තිබුණේ මුදල් වර්ෂය අවසන් වීමට දින 04 ට පෙර දී ය. (27.12.2013) මේ හේතුව නිසා 2013 වර්ෂයේ මිලදී ගැනීමේ සැලසුමට අනුව ස්ථාවර වත්කම් මිලට ගැනීමට නොහැකි වී ඇත. 2013 වර්ෂයේ ඉතිරි වී ඇති අතිරික්ත මුදල් වැය කරමින් ස්ථාවර වත්කම් මිලට ගැනීමට 2014 වර්ෂයේ සැලසුම් කර ඇත.

05 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

05.1 <u>අභ්‍යන්තර විගණනය</u>

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය විසින්, ඉංග්‍රීසි භාෂා පශ්චාද් උපාධි ආයතනයේ වාර්ෂික විගණනය සිදු කරනු ලැබේ.

05.2 අයවැය ලේඛනමය පාලනය

2013 වර්ෂයේ තථ්‍ය ආදායම් වියදම් සහ අයවැය ගත ආදායම් වියදම් අතර විචලනය පහත පරිදි වේ.

| | අයවැය ගත දත්ත | තථ්‍ය දත්ත | විචලන | විචලනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| අභ්‍යන්තර ආදායම | 2,337,000.00 | 4,116,254.00 | 1,779,254.00 | 76% |
| පුනරාවර්තන වියදම් | 11,851,000.00 | 10,643,464.00 | 1,207,536.00 | 10% |

05.3 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

ආයතනයේ 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව මූලිකව 2013 වර්ෂයේ ජූලි මස 05 වන දින ඉදිරිපත් කොට ඇත. එය මැයි මස අවසන් වීමට ප්‍රථම ඉදිරිපත් කිරීමට නියමිත වුවත් අදාළ වර්ෂය සඳහා වන විගණන වාර්තාව ප්‍රමාද වීම හේතුවෙන් එය ලැබෙන තෙක් අපේක්ෂාවෙන් සිට ජූලි මස දී වාර්ෂික වාර්තාව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කෙරිණි. අදාළ විගණන වාර්තා ලැබීමෙන් අනතුරුව 2014 මාර්තු මස දී පාලන හා ගිණුම් වාර්තා පිටපත් 07 කින් ඉදිරිපත් කෙරිණි.

ඉන් අනතුරුව 2014.03.27 දිනැති උසස් අධ්‍යාපන අමාත්‍යාංශ සහකාර ලේකම්/පාලන ලිපියට අනුව 2014.04.01 දිනැති අදාළ ගිණුම් වාර්තා සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්වුණු අතර ඒ සඳහා ආයතන අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සහභාගී විය.

මේ වනවිට භාෂාත්‍රයෙන් යුතුව අවසන් පිටපත සකස් කොට 29.08.2014 දින යවනු ලැබ ඇත.

6. පද්ධති හා පාලන

අයවැය පාලනය, සේවක කළමනාකරණය සහ අධ්‍යයන කටයුතු කළමනාකරණය යන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානයකින් යුතුව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

ආචාර්ය එච්.වී.එම් රත්වත්ත මිය,
අධ්‍යක්ෂ,
පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය.

**Dr.H.V.M.Ratwatte**
**PhD (Edin,UK), Msc (Edin), BA Hons (Pdn,SL)**
**Director**
**Postgraduate Institute of English**
**The Open University of Sri Lanka**
**Nawala, Nugegoda.**

8